# රතු තරුව
# செந்தாரகை

සිංහල දෙමළ බසින් පළවන එකම සමාජවාදී පුවත්පත - එක්සත් සමාජවාදී පක්ෂයේ ප්‍රකාශනය


එක්සත් සමාජවාදී පක්ෂය උතුරේ හා දකුණේ කම්කරු පංතියේ හා පීඩිත ජනතාවගේ ඒකාබද්ධ ජන අරගලයක් තුලින් කුරිරු ධනපති ක්‍රමය පෙරලා දමා සැලසුම් සහගත ආර්ථික වැඩපිළිවෙලක් තහවුරු කර ප්‍රජාතන්ත්‍රීය සමාජවාදී පාලනයක් ගොඩනැගීමට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් කටයුතු කරයි. එම ඉලක්ක ජය ගැනීම සඳහා පහත සඳහන් මූලික කරුණු වෙනුවෙන් අප පක්ෂය පෙනී සිටී.




2015 - ජූනි / ජූලි - 108 කලාපය - QD/162 | පුවත්පතක් ලෙස මහ තැපැල් හලේ ලියාපදිංචි කරන ලදී | මිල රු. 20.00



| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| wd K ag f l dhsgo @ අන්තෝජාටා බහී ජාටා 2 | 20 කාටද කා වෙනුවෙන්ද ? 3 | නිමක් නොදුටු වමේ පාවාදීම් 4 | මාක්ස්වාදය හා ත්‍රස්තවාදය 5 | මාක්ස් නිවැරදිය 6 | විත්‍යා හා කාන්තාව 7 | රු 2500 /= දියව් 8 | එක්සත් සමාජවාදී පක්ෂයේ වෙබ් අඩවියට පිවිසෙන්න www.lankasocialist.com |


# රට නැවතත් අනතුරක් අභියස ?

ඒකාධිපති වියරුවෙන් පෙලුන මහින්ද රාජපක්ෂගේ පවුල් පාලනය පෙරලා දැමීමට ජනවාරි 8 වෙනිදා බහුතරයක් ජනතාව තීන්දු කරනු ලැබීය. එම පරාජය මහින්ද රාජපක්ෂ රෙජිමයේ කිසිවෙකු අපේක්ෂා නොකල දෙයක් විය. ජනතා තීන්දුවෙන් බලයෙන් පහ කළ මහින්දට පරාජය අදහා ගත නොහැකිව උමතුවෙන් කටයුතු කරනු පෙනේ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති ධූරයට ජනතාව පත් කළේ ඔහු කෙරෙහි තැබූ විශ්වාසයකට වඩා මහින්ද රාජපක්ෂ පරාජය කිරීම සඳහා ජනතාවට තිබූ දැඩි උවමනාව නිසාය.

විශේෂයෙන් උතුරේ හා නැගෙනහිර දෙමළ හා මුස්ලිම් ජනතාව මෛත්‍රීපාලට ඡන්දය ප්‍රකාශ කළේ ඔහු ගැන තිබෙන විශ්වාසයකට නොවන බව පැහැදිලිය. රාජ්‍ය මර්ධනයේ ගහලයාවූ මහින්ද බලයෙන් පහ කිරීම ඔවුන්ගේ ආසන්න බලාපොරොත්තුව විය. මේ අතර දින 100 ද ඉක්මවා ගොස් ඇති අතර යන්නේ කොහේදැයි නොදැන මෛත්‍රීගේ ආණ්ඩුව අඳුරේ ගමන් කරමින් සිටී. පරාජිත රාජපක්ෂ සමග මිනීමරුවන්, ස්ත්‍රී දූෂකයන්, මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවන්, කැලෑ පාලුවන් මෙන්ම කැසිනෝ අයිතිකරුවන්ද එක පෙරහැරේ ගමන් කරති. සිංහල ජාතිවාදය තිරස් චීන ලෙස අවුලුවා දකුණේ ජනතාවගේ ඡන්දය කොල්ලකා පාර්ලිමේන්තු බලය කෙසේ හෝ අල්ලා ගැනීම මෙම රොත්ත බුරුත්තගේ උවමනාව බව පැහැදිලිය. මෙම පරිසරය තුළ මහින්ද කල්ලිය නැවත බලයට පැමිණිය හොත් රටම ජාතිවාදී ලේ විලක් බවට පත්වනු ඇත.

අනෙක් පැත්තෙන් ජනතාව මෛත්‍රීපාලනය කෙරෙහි තැබූ විශ්වාසය සීඝ්‍රයෙන් බිඳ වැටෙමින් පවතී. මෛත්‍රී හෙළ උරුමය හා රතන වැනි ජාතිවාදී බලවේග වල ග්‍රහණය මත තීන්දු ගන්නා තත්වයට පත්ව ඇත. කම්කරු පංතිය, ගොවි ජනතාව, තරුණයින් හා ශිෂ්‍යයින් මෙන්ම උතුරේ දෙමළ ජනතාවද මෛත්‍රී පාලනය කෙටි කලකින් බලාපොරොත්තු කඩා දැමූ ආණ්ඩුවක් ලෙස ඉතිහාසයේ වාර්තා ගත වෙන බව පවසති. මේ අතර රුපියල බාල්දු වෙමින් ආර්ථිකය කඩා වැටෙන ලකුණු පෙන්නුම් කර ඇත. මෙම පසුබිම තුළ රටේ හා ජනතාවගේ අනාගත ඉරණම තීන්දු කිරීමට ධනපති පංතියේ ප්‍රධාන පක්ෂ දෙකට බාර දී බලා සිටීම ඉතාම අනතුරුදායකය. සාමාන්‍ය ජනතාව සමාජයේ බහුතරය වෙනුවෙන් දේශපාලන ඉදිරිමග තීන්දු කිරීමේ වගකීමට උරදිය යුතු කාළය එළැඹ ඇත. රට අඳුරෙන් මුදවා ආලෝකය වෙත හැරවීමට තිබෙන එකම මාවත කම්කරුවන් හා ගොවින්ගේ ආණ්ඩුවක් වෙනුවෙන් සටන් වැදීම තුළ පමණය. තව දුරටත් කල් මරමින් බලා නොසිට ධනපති පංතියේ කදවුරු වලට එරෙහිව ඉදිරි මැතිවරණයේදී වමේ බලයක් ගොඩ නැගීම සඳහා ඉදිරිපත් වන ලෙස කම්කරු හා පීඩිත ජනතාව වෙත අපි අයාචනය කරන්නෙමු.

## මෛත්‍රී පොත කාගේද?

**"මේ ගැනත් හිතන්න"** නමින් මෛත්‍රීපාල ජනාධිපති වරයා වෙනුවෙන් සැකසුන පොතක් පසුගියදා එළිදැක්විය. එසේ වුවද මෙම පොත පිටවීමත් සමග ශ්‍රීලනිපය මී මැසි කුඩුවක් මෙන් ඇවිස්සී ඇත. සුසිල් ප්‍රේමජයන්ත හා අනුර ප්‍රියදර්ශන මේ ගැන කිය සිටියේ මෙය කැළෑ පත්තරයක් බවය. ශ්‍රීලනිපයේ සභාපති හා රටේ ජනාධිපතිවරයා ගැන සඳහන් පොතකට රාජපක්ෂ සමයේ එහෙව් ප්‍රකාශයක් කලේ නම් උන්දෑ මේ වන විට ජීවතුන් අතර සිටිය නොහැකිය.

### පුදුමයකි අයිතිකරුවකු නැත.



මේ වන විට ශ්‍රීලනිපය කෑලි කිහිපයකට කැඩී ඇති බව පෙනේ. මෛත්‍රීපාල කණ්ඩායම මහින්ද රාජපක්ෂ කණ්ඩායම හා දෙපැත්තටම නැති ඊනියා මධ්‍යස්ථ කණ්ඩායම් ඒ අතර වෙයි. මහින්ද පිළ ඉලක්ක කර තිබෙන සිංහල ජාතිවාදී බලවේග කෙසේ හෝ මෛත්‍රී වෙත දිනා ගැනීම එම පොතේ එක අරමුණක්ව තිබෙන බව පෙනේ. මෛත්‍රී පාල සිංහලයේ නායකයෙකු ලෙස පිම්බීමට දරණ උත්සාහය එහි පැහැදිලිව ඇත්තේ ඒ නිසා විය යුතුය.මෛත්‍රී කොටි හිතවාදී බලවේග වලට උදව් දෙනු බව මහින්දපිළ පසුගිය කාළය පුරාම මෛත්‍රීට චෝදනා නගා තිබේ.

කෙසේ වුවද ශ්‍රීලනිපය තුළ ඇති වෙමින් තිබෙන ගැටුම පහසුවෙන් සමනය කර ගත නොහැකිය. මහින්ද රාජපක්ෂ පසුගිය වසර 9 තිස්සේ මෙරට සියලු දේශපාලන පක්ෂ අර්බුදයට යවා පක්ෂ දෙකඩ කිරීමට කටයුතු කළේය. අවසානයේදී මහින්ද දැන් ඒ ඉරණම ශ්‍රීලනිපයට උරුම කර ඇති බව ශ්‍රීලනිප සමාජිකයෝ පවසති .

## මීතොටමුල්ල කුණු කන්ද තවමත් එතැනමය



කොළොන්නාව ප්‍රදේශය පසු ගිය වසර කීපය තුලම නිතර නිතර වාර්තා තැබූ ප්‍රදේශයක් විය. දුමින්ද හා භාරත ලක්ෂමන් ගැටුම අවසන් වූයේ ජනාධිපති උපදේශක ඝාතනය කිරීමෙනි. ඒ සමග කොළොන්නාව ප්‍රදේශයම කුඩු මත්ද්‍රව්‍ය ජාවාරම පවත්වාගෙන යනු ලබන මධ්‍යස්ථානය බවට නිරන්තරව වාර්තාවිය. වෙලේ සුදා ඇතුලු කුඩු රජවරු කීප දෙනෙකු අත් අඩංගුවට ගැනීම සමග ඔවුන් පිටු පස සිටි දේශපාලඥනයින් තරමක නිහැඩියාවක පසුවෙති.

මේ දිනවල කොළොන්නාව මීතොටමුල්ල ප්‍රදේශයම කුණු කන්දේ ප්‍රශ්නය නිසා රත් වී තිබේ. ජනාධිපතිවරණ සමයේ සිරිසේන මහතා කුණු ප්‍රශ්නය විසදා දෙන බවට පොරොන්දු දුන් බව ප්‍රදේශයේ පදිංචි කරුවෝ අප සමග පැවසීය. එහෙත් කුණු කන්ද ඉවත් කිරීම සිතූ තරම් ලෙහෙසි පහසු දෙයක් නොවන බව සිරිසේන මහතාට තේරී ඇතැයි පෙනෙන්නේ ඔහු දැන් ඒ ගැන නිහඬව සිටින නිසාය.

දවසේ පැය 24 පුරාම කුණු කන්ද අභියස ජීවත් වන ජනතාව එයින් හමායන දුර්ගන්ධය පමණක් නොව මදුරුවන්, මකුනන් හා වෙනත් සතුන් බහුලව ව්‍යාප්ත වීමද, එම නිසාම කායික වශයෙන් හා මානසික වශයෙන් රෝග වලට ගොදුරු වීමටද, සිදුව ඇත. උපදින දරුවන් හා අඩු වයසේ දරුවන්ට විශේෂයෙන් මෙම පරිසරය ඔරොත්තු නොදෙන නිසා දරුවන් නිරන්තරව විවිධ රෝග වැළ දෙන බවද ප්‍රදේශවාසින් පවසති. එහෙත් කොළඹ නගර සභාව මෙන්ම මෛත්‍රී - රනිල් ආණ්ඩුවද මේ ගැන අවධානය යොමු කිරීමට සූදානමක් නොමැති බව පැහැදිලි බවද ඔවුන් කියති.

මේ අතර කුණු කන්දේ ප්‍රශ්නය සම්බන්දව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ විභාගවූ අවස්ථාවේදී අධිකරණය කොළඹ මහනගර සභාවට මීතොටමුල්ල ප්‍රදේශයට කුණු නොදැමීම සඳහා තිබෙන විකල්ප විසඳුම් කුමක්ද යන්න වාර්තා කරන ලෙසට කොළඹ නගර සභාවට නියෝග කළේය. මෙම නඩු විභාගය නැවත ජුනි මස 19 දින යළි කැඳවීමට නියමිතය. පාලකයෝ නිහඬව බලා සිටින අතර කොළොන්නාව - මීතොටමුල්ල ජනතාව තවමත් කුණු කන්ද සමග ජිවිතය හා මරණය අතර සටනක නිරතව සිටිති.

## අවනඩුව



මිස්ටර් ක්ලීන් ගහගන්නට කතා කරයි
ජන්දෙකටම යන්නට අභියෝග කරයි
දින සීයේ යහපාලනේ අඬා වැටෙයි
පොලිටික්කෝ ජනතාවට බයිලා කියයි

උඩු රැවුල කරකවමින්
මරා එයි පන්සල්ම සොයමින්
පන්සිල් ද දෙසමින්
හොරුන්ගෙත් හොරු වෙසෙති යහතින්

**ධනවාදයට හා ජාතිවාදයට එරෙහි වමේ බලයක් කරා පෙරට ....**

රතු තරුව සෙන්තාරක෈

53/6 ඊ.ඩී.දාබරේ මාවත, කොළඹ 05.
E.mail – unitedsocialists@gmail.com
Tel – 4510289 / 2504647
එක්සත් සමාජවාදී පක්ෂයේ වෙබ් අඩවියට පිවිසෙන්න - www.lankasocialist.com

## හොරුන්ගෙත් හොර සහ හොරු වෙනුවෙන් හොරු

පසුගිය ජනාධිපතිවරණ සමයේදී ප්‍රධාන ප්‍රචාරක තුරුම්පුවක් වූයේ රාජපක්ෂ පාලනය තුළ පැවති වංචා - දූෂණ සහ සොරකම්ය. දකුණුකරයේ මීට කලින් වතාවල මහින්ද රාජපක්ෂට ඡන්දය දුන් සිංහල ජනයා ඔහුට එරෙහි වීමට බලපෑ එක ප්‍රධාන කරුණක් වූයේ එයයි. ඔහුගේ පවුල් පාලනය වැඩ කළ හැසිරුන ස්වභාවය අනුව මහජන මුදල් සෙල්ලම් කාසි මෙන් එහාට මෙහාට විසි කරන ලදී. නීතියෙන් නියමිත සියලුම පටිපාටි ඉවත දමා වීරවිල ගුවන් තොටුපොළක් ඉදිකිරීමට මුල්ගල් තැබීමේ උත්සවයක් පවත්වන ලද්දේ රුපියල් මිලියන ගණනක් වියදම් කරමිනි. එහෙත් පසුව එම ගුවන් තොටුපළ ඉදිකිරීම අත්හිටුවන ලදි. ඒ සඳහා කරන ලද මහජන මුදල් නාස්තිය ගැන වගකිව යුත්තෙක් අද වන තුරු නැත.

පසුගිය සතියේ පාර්ලිමේන්තුවේ දී හෙලිදරවු වූ පරිදි මත්තල ඉදිකරන ලද ගුවන් තොටුපොළ විවෘත කිරීමේ උත්සවය සඳහා රුපියල් ලක්ෂ හැට හයක් වැය කොට ඇත. තම නමින් එම ගුවන් තොටුපොළ තමාම නම් කරගත් මහින්ද රාජපක්ෂ එම උත්සවය සඳහා තම පෞද්ගලික මුදල් සතයක් හෝ වැය කලේ නැත. මෙය හුදෙක් මහජන මුදල් නාස්ති කිරීමක් පමණක් නොවේ එය අක්‍රමිකතාවකි එයින්ද එහාට ගිය මහජන මුදල් ගසා කෑම්ද වේ. මෙසේ පොදු ජාතික ධනය කාබාසිනියා කල රාජපක්ෂ ඒවා නොසිදු වූ සේ අදත් යෙහෙන් වැජඹෙයි.

මාස හයක් පමාවී ඇතත් වත්මන් යහපාලන ආණ්ඩුව රාජපක්ෂ රෙජිමයේ දූෂණ වංචා සොයා බැලීමට නිසි ලෙස යොමු වී ඇති බවක් නොපෙනේ. විශේෂයෙන්ම ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක අමාත්‍යංශය මෙහෙයවූයේ තමාගේ බූදලයක් මෙනි. නාගරික සංවර්ධන විෂයයද ඔහු යටතට පත් කල පසු කොළඹ ලස්සන කිරීමේ මුවාවෙන් සිදු කලේ මුදල් නාස්තියක් සහ ගසා කෑමකි. හොඳට තිබූ පදික වේදිකා කඩා ඒවාට වෙනත් ආකාරයක ගල් අතුරා ලස්සනක් මවා පෙන්වන ලදි. කොම්පඤ්ඤවීදියේ ඔප්පු තිරප්පු සහිත වසර සිය ගණනක් ජීවත් වූ ජනයා බලහත්කාරයෙන් ඉවත් කොට එම ඉඩම් ඉන්දියාවේ ටාටා සමාගමට පවරන ලද්දේ කුමන පදනමක් මත දැයි අදටත් අබිරහසකි.

රාජපක්ෂ පාලනයේ දූෂිතම ක්‍රියාදාමය වූයේ මහා පරිමාන ව්‍යාපෘති කිසිදු ටෙන්ඩර් කැඳවීමකින් තොරව තමන්ගේ හිතු මනාපයට ආයෝජකයන්ට පැවරීමයි. මේවා සියල්ලක්ම පාහේ පවරන ලද්දේ චීන සමාගම් වලටය. කොළඹ නෙලුම් පොකුණ රඟහල, උතුරු අධිවේගී මාර්ගය හා කොළඹ වරාය නගරය මේ අතුරින් ප්‍රධානම ව්‍යාපෘති බව කිව හැකිය. චීන සමාගම්වලට මේ ව්‍යාපෘති පවරා දුන්නේ කුමන පදනමකින්ද ඒවා තෝරා ගත්තේ කෙසේද සහ මේ ව්‍යාපෘති සඳහා ගෙවන මුදල නිශ්චය කලේ කෙසේද යන්න ගැන නිශ්චිත තොරතුරු ලැබී නැත. මීට අමතරව රාජපක්ෂ පාලන සමයේ දී ඉදි කරන ලද අධිවේගී මාර්ග සහ වෙනත් ප්‍රධාන මාර්ග ව්‍යාපෘති කීපයකම වියදම් ඇස්තමේන්තු කිසිසේත් පිළිගත නොහැකි අධිකතර වියදම් බව ශ්‍රී ලංකාවේ ප්‍රවාහන සහ මහා මාර්ග ක්ෂේත්‍රයේ සිටින ප්‍රවීනතම විශේෂඥයා වන මොරටුව විශ්ව විද්‍යාලයේ මහාචාර්ය අමල් කුමාරගේ විසින් සාධක සහිතව පෙන්වා දී ඇත.

මේ ආකාරයෙන් මහා පරිමාන ව්‍යාපෘති ඉදිකිරීමේදී රාජපක්ෂ පාලනය විසින් යටිමඩි ගහන ලද මුදල් ප්‍රමාණය කෝටි ගණනක් වන බව නිසැකය. අපේ රටේ නීතියේ පවත්නා තත්වය තුළ මේ වංචාවන් සොයා ගැනීම එතරම් පහසු නැත. රාජපක්ෂ පවුලේ කිසිවකුත් මේ මුදල් තමන්ගේ නම් වලින් හෝ තමුන් ළඟ තබා ගෙන සිටිතැයි කිසිසේත් සිතිය නොහැකිය. ඔවුන් මෙරට පමණක් නොව එතෙර බැංකුවල පවා වෙනත් නම් වලින් මුදල් තැන්පත් කර හෝ දේපල මිලදී ගෙන ඇති බවට වාර්තා පළවී ඇත්තේ මේ නිසාය. උඩින් පල්ලෙන් අතගෑමෙන් පමණක් මේ සුවිශේෂී වංචා - දූෂණ සොයා ගැනීමට හැකියාවක් නැත. මෙසේ යටිමඩි ගහන ලද මුදල් සෙවීමට ඇමරිකාවේ ඉන්දියාවේ සහ ලෝක බැංකුවේ සහය ලබා ගන්නා බව වත්මන් රජය විටින් විට ප්‍රකාශ කළ ද නිශ්චිත වැඩ පිළිවෙලක් සහ කාලරාමුවක් මත ඒ සඳහා යොමු වී ඇති බවක් නොපෙනේ. මේ හේතුවෙන් රටේ ජාතික ධනය ගසා කෑ පාදඩ දේශපාලකයන්ට තවමත් යහතින් වැජඹෙන්නට ඉඩ ලැබී ඇත.

අනෙක් අතට මේ හොර කල්ලිය එකතු වී එකිනෙකා ආරක්ෂා කර ගැනීමට යොමු වීමේ පිළිවෙතකට යොමු වී ඇති බවත් ද පෙනී යයි. වංචා - දූෂණ සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා හිටපු දේශපාලකයන් සහ නිලධාරීන් කැඳවීම පවා පලිගැනීම් ලෙස හුවා දැක්වීමට තරම් මේ හොරකල්ලි ඉදිරියට පැමිණ ඇත. විමල් වීරවංශ මුදල් උපයාගත් ඉඩම් මිලදී ගත් සහ නිවාස ඉදි කළ ආකාරය ගැන විවිධ වාර්තා පලවන්නට ගත්තේ මීට වසර පහකට පමණ පෙර සිටය. රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීවරයාගේ වත්කම් පිළිබඳව අල්ලස් පරීක්ෂණ ඇරඹුනේ මීට වසර දහයකටත් පෙර සිටය. දූෂණ - වංචා චෝදනා එල්ල වූ මොවුන් සියලු දෙනාම අද ''මහින්ද සමග රට දිනවමු'' යන තේමාවට මුවා විය. එහෙත් මීට පෙර උන්ගේ තේමාව වූයේ ''මහින්ද සමග නැගිටිමු'' යන්නය. මොවුන්ගේ වැඩ පිලිවෙලේ ඇත්ත අර්ථය ඇත්තේ එතැනය. මහින්ද සමග හැර ඔවුන්ට පැවැත්මක් නැත. කර ඇති වංචා - දූෂණ වලින් බේරී සිටිය හැක්කේ මරා ට මුවාවීමෙන් පමණි.

පවත්නා නීතියේ සතර කොන්වලට මහා පරිමාන දූෂණ කොතෙක් දුරට කොටු කර ගත හැකිද යන්න ප්‍රශ්නයක් වුවද රාජපක්ෂ රෙජිමය හොර ගුහාවක් බව ජනතා සිත්සතන් වල පැලපැදියම් වී ඇති කරුණකි.මහින්ද රාජපක්ෂ මේ හොරුන් වංචා කරුවන් වෙනුවෙන් කොයිතරම් දුරට පෙනී සිටින්නේද යන්නෙන් ඒ බව වඩාත් තහවුරු වේ. එක අතකට හොර කල්ලිය එකට ගොනු වීම හොඳය. ඇතැම් සතුන් තමන්ගේ ආරක්ෂාව සඳහා එකට රංචු ගැහෙන්නාක් මෙනි.

මෙහිදී අප දේශපාලනික වශයෙන් තේරුම් ගත යුත්තේ මේ හොරකම් වංචා දූෂණ වත්මන් ගෝලීය ධනවාදයේ ආවේනික ලක්ෂණයක් බවය. ලංකාව වැනි පසුගාමී ධනපති රටක මේ තත්වය ඉහළ සිට පහළටම ඔඩු දුවා ඇත. මෛත්‍රී - රනිල් යහපාලන ආණ්ඩුවෙන් මෙයට විසඳුම් බලාපොරොත්තු වීම බරපතල වරදකි. ඔවන්ද මේ මහා පරිමාණ දූෂණ වලට අඩු වැඩි වශයෙන් සම්මාදම් වී ඇත. මේ තත්වය වෙනස් කළ හැක්කේ මෙරට දේශ පාලනය උඩු යටිකුරු කර සිටවීමෙන් පමණි. ඒ සඳහා විප්ලවීය දේශපාලන පරිවර්තනයක් අවශ්‍යය. වංචා - දූෂණය - ගසා කෑම අවශ්‍ය නොවන සාධාරණ සමාජ ක්‍රමයක් සමාජවාදී සමාජයක් ගොඩ නැගීමට අප කැපවිය යුත්තේ එහෙයිනි.

# wdKaqj fldhsago @

**මෛත්‍රීගේ යහපාලන ආණ්ඩුව රුවල කැඩුන නැවක් මෙන් ඉබා ගාතේ පාවෙමින් පවතී. ජනවාරි 8 දින රාජපක්ෂ පාලනය පරාජය වීම සමග ආණ්ඩුව විසුරුවා හැර මහ මැතිවරණයකට ගමන් කළේ නම් ජනතාව කැමති ආණ්ඩුවක් බලයට පත් කර රට තුළ එක්තරා දුරකට අද පවතින ආරාජිකත්වය වලක්වා ගැනීමට හැකියාව තිබුණි. රනිල් ඇතුලු එජාප නායකයින් දින 100 වැඩ පිළිවෙලක් ඉදිරිපත් කලේ වැඩ පෙන්වා ජනතා විශ්වාසය දිනා ගෙන එජාප ආණ්ඩුවක් පිහිටුවා ගැනීමට තිබෙන හොඳම මාර්ගය එය බව ඔවුන්ගේ තේරුම් ගැනීම වී තිබූ නිසාය.** එජාප නායකත්වයට ජනතා විශ්වාසය දිනාගැනීම ගැන විශ්වාසයක් නොතිබීම ඊට හේතුවයි. නමුත් අද වන විට දින 100 පාරාවලල්ලක් බවට පත්ව ඇත. දින 100 ඉක්ම යැමෙන් පසුව ආණ්ඩුව විසුරුවා හැර මහ මැතිවරණයක් කැඳවීමට මෛත්‍රී - රනිල් අතර තිබූ එකඟ තාවය ද මෛත්‍රී විසින් බිඳ දමා ඇති බව තේරුම් ගැනීම අපහසු නැත. දැන් මෛත්‍රී කැස කවන්නේ ශ්‍රීලනිප ආණ්ඩුවක් සදා ගැනීමටය. ඒ සඳහා රාජපක්ෂගේ එකඟතාවය ඔහුට අවසන් වශයෙන් ලැබෙනු ඇත.

රාජපක්ෂ රෙජිමය බිඳ වැටීමෙන් පසු මෛත්‍රී ශ්‍රීලනිපය බේරා ගැනීමේ අසීරු උත්සාහයක යෙදී සිටිමේ ප්‍රතිපලයක් ලෙස ඔහු ඒ අත මේ අත පැද්දෙමින් නිනච්චක් නොමැතිව කල් මරමින් සිටී. ඒ අතර පරාජිත මහින්ද රාජපක්ෂ ජාතිවාදී බලවේග අවුලුවමින් අන්ත දූෂිත බලවේග සමග ශ්‍රීලනිපය තමන්ට අවනත කර ගැනීමේ දුෂ්ට ක්‍රියාවලියක යෙදී ඇත. අනෙක් පැත්තෙන් දේශිය ධනපති පංතියේ ප්‍රධාන නියෝජිතයින් වන ධම්මික පෙරේරා, කෙලී මහරාජා, ටිරාන් අලස්, හැරී ජයවර්ධන වැනි ආර්ථික දැවැන්තයින් රාජපක්ෂ පාලනය සමයේ නිදැල්ලේ සිදු කරගෙන ගිය ආර්ථික මංකොල්ලය රැක ගැනීම සඳහා මහින්ද සමග රංචු ගැසීම පෙන්නුම් කෙරේ. ජනතා බලවේග වලට වඩා මහින්දගේ ශක්තිය රදා පැවත ඇත්තේ ධනපති පංතියේ මෙම දූෂිත ස්ථරය මතය. මෙම ක්‍රියා වලියට චීන ආණ්ඩුව හා ඒ හා සම්බන්ද විශාල සමාගම් ද එක්ව කටයුතු කරන බව තේරුම් ගැනීම අපහසු නැත. ඒ අතර මෝඩි හා ඉන්දියානු ආණ්ඩුව බලයට කැදර කමින් සටන් වැද සිටින. මහින්දගේ වියරු බල අරගලයට කෙලින් සහයෝගය නොදුන්නද රනිල් සමග බටහිර අධිරාජ්‍යවාදී රටවල් සමග වර්ධනය වෙමින් පවතින සම්බන්දය ගැන සතුටකින් සිටින බවක් නොපෙනේ.

මහින්ද අගමැති අපේක්ෂකයා ලෙස නම් කිරීම සඳහා ශ්‍රීලනිපයේ නිල



නායකයින් වන මෛත්‍රීපාල හා නිමල් සිරිපාල වෙත ගෙන එනු ලබන බලපෑමේ යටි අරමුණව තිබෙන්නේ රාජපක්ෂ පවුලේ හා ඔවුන්ගේ ගජමිතුරු මහා පරිමාණ දූෂකයින් නීතියේ රැහැනෙන් බේරා ගැනීමේ අරගල යයි. එජාප නායකත්වයෙන් ආණ්ඩුවක් පිහිටුවා ගනු ලැබුවහොත් රාජපක්ෂ පවුල හා රෙජිමය හා සම්බන්ද අයගේ අනාගත ඉරණම ගැන ඔවුන් බියට පත්ව සිටින බවට සැකයක් නැත.

මුලින්ම අසමත්ව සිටී. මෙම පසු බිම තුළ දෙමළ ජාතික සන්ධානය දෙමළ ජනතාව ඉදිරියේ තියුණු පරීක්ෂණයකට ලක් වෙමින් ඇත. දෙමළ සන්ධානය රනිල් ඇතුලු නායකයින් සමග කොළඹ දී සීත කාමර ඇතුලේ සිදු කෙරෙන සාකච්ජාවන් තුලින් උග්‍ර ප්‍රශ්න වලින් කැකෑරෙන දෙමළ ජනතාව සමග සෙල්ලම් කරමින් කාලය මරති.

දකුණේ දිග හැරෙමින් පවතින අවුල් සහගත තත්වය බරපතලය. ඒකාධිපති වියරුවෙන් පෙලුන රාජපක්ෂ රෙජිමය කුජීත ලෙස පරාජය කිරීමට ජනවාරි 8 වෙනිදා රටේ බහුතරයක් ජනතාව තීන්දු කරන ලදි. මෛත්‍රී - රනිල් ආණ්ඩුව බිහිවූයේ එහි ප්‍රතිපලයක් ලෙසිනි. ජනාධිපතිවරණයේදී මෛත්‍රී දුන් දින 100 පොරොන්දු පත්තරය ක්‍රියාවට නැංවීම අලුත් ආණ්ඩුවේ ප්‍රමුඛ කාර්ය විය. එසේ වී නමුදු දින 100 වැඩ පිළිවෙලින් පොරොන්දු වූ අයුරින් ක්‍රියාවට නැගීමට මෛත්‍රී පාලනය අසමත් විය. සියලු පොරොන්දු කෙසේ වෙතත් අත ගැසූ පොරොන්දු පවා ක්‍රියාවට නැගුනේ බාගෙයටය. විධායක

# අන්තෝ ජටා බහී ජටා

මේ වන විට රට තුළ දිග හැරෙමින් පවතින ආරාජිකත්වය ගැන හෝ මෛත්‍රී - රනිල් අනුගමනය කරන නව ලිබරල් ආර්ථික වැඩ පිළිවෙල තුල සිදුවන විනාශය ගැන විවේචනයක් හෝ විරුද්ධත්වයක් රාජපක්ෂ වාදීන්ට වැදගත් නොවේ. කම්කරු පංතිය දුගී ගොවි ජනතාව ගැන ඔවුන්ට වැදගත් කමක් නැත. යුද්ධයෙන් පසු තවමත් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය නොමැතිව පීඩා විඳින උතුරේ දෙමළ ජනතාවගේ ප්‍රශ්න කෙරේ විසඳුම් ලබා දීම හා ජාතික ප්‍රශ්නයට ධනේශ්වර සීමාවන් තුළ ලබා දෙන බවට පොරොන්දු වූ දේශපාලන විසඳුම් ගැන කථා කිරීමට ජාතිවාදය කර පින්නා ගත් රාජපක්ෂ බලවේග යට අවශ්‍ය නොවේ. උතුරේ දෙමළ සමාජය නැවතත් බලාපොරොත්තු බිඳ වැටුන සමාජයක් බවට පත්ව තිබෙන අතර දෙමළ ජාතික සන්ධානය (TNA) ඊට විසඳුම් ඉදිරිපත් කිරීමට සහ

ජනාධිපති ක්‍රමය අහෝසි නොවුන අතර එහි බලතල ප්‍රමාණයක් කප්පාදු කෙරින. ( විලිලැජ්ජා නැති මහින්ද රාජපක්ෂ



විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරිම ගැන දැන වහසි බස් දොඩවනු පෙනේ.)

-තාරක-

3 පිටුව බලන්න .....

# 20 කාටද ? කා වෙනුවෙන්ද ?

පවතින මැතිවරණ ක්‍රමය යහපත් අයුරින් වෙනස් කර ගැනීමේ දේශපාලන අවශ්‍යතාව මේ සමාජයට කලෙක සිට තිබුණකි. එය වෙනස් කිරීමේ මූලික අවශ්‍යතාව තිබුයේ වඩා පිරිසිදු හා ශක්තිමත් ජනතා නියෝජනයක් සහිත දියුණු පාර්ලිමේන්තුවක් පත්කර ගැනීමටය. ඒ සඳහා සමස්ථ මැතිවරණ ක්‍රියාවලිය දූෂණයෙන් තොර මැතිවරණ ක්‍රියාලියක් විය යුතු අතර තරඟ වදින දේශපාලන පක්ෂද පිරිසිදු මුදල් ගනුදෙනු සහිත ජනතාවට වග කියන්නාවූ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ විය යුතුය. එනිසා මැතිවරණ ක්‍රමයෙහි කෙලවර පමණක් වෙනස් කිරීමට 20 වන සංශෝධනය ලෙස යෝජනා කරන මේ ප්‍රතිසංස්කරණ කිපයෙන් මේ සමාජය ඉල්ලා සිටින යහපත් ප්‍රජාතන්ත්‍රවාදී වෙනස සිදුවන්නේ නැතැයි අපි පළමුව කියමු.

මැතිවරණ ක්‍රමයෙහි සියලු දෝස මනාප ජන්දයට බාරදීම පහසු වුවත් එය මුසාවකි. ඒවාට උත්තරයක් ලෙස පැරණි මන්ත්‍රී ආසන ක්‍රමය අනුපාත ක්‍රමයට බද්ධ කිරීමෙන් මැතිවරණ ක්‍රියාවලිය ශිෂ්ඨ වන්නේ නැතැයි ද අපි කියමු. මැතිවරණ ක්‍රමය එසේ ශිෂ්ඨ කළ හැකි නම් ඉන්දියාවේ පාර්ලිමේන්තුව වැදගතුන්ගෙන් පිරී සුපිරි පාර්ලිමේන්තුවක් විය යුතුය. එහෙත් අපරාධ චෝදනා ඇති මන්ත්‍රීවරුන් 186 ක් වර්තමාන ඉන්දීය පාර්ලිමේන්තුවට තේරී පත්වී ඇත. ඉන්දියාවේද ප්‍රශ්නය වී ඇත්තේ ද දූෂිත ව්‍යාපාරිකයන් හා කලු සල්ලි අපුල්ලනවුන් සමග දේශපාලන පක්ෂ හා දේශපාලඥයන් තබා ගන්න නොකියවෙන සම්බන්ධයයි. මැතිවරණ ක්‍රියාවලියේ එක කෙළවරක් වෙනස් කිරීමෙන් පමණක් ඒ දූෂිත මාවත් අහුරා දමන්නට නොහැක. එනිසා දේශපාලන පක්ෂ විසින් ගොඩනගා ගන්නා මැතිවරණ අරමුදල් හා අපේක්ෂකයන්ගේ මැතිවරණ අයවැය කල් තබා ප්‍රසිද්ධ කිරීමේ නෛතික කොන්දේසි අඩු තරමින් මැතිවරණ ක්‍රම ප්‍රතිසංස්කරණයට ඇතුලු නොකළහොත් ඉදිරි මැතිවරණද දූෂිත මන්ත්‍රීවරුන්ගෙන් පිරී පාර්ලිමේන්තුවක් පත්කරගනු ඇතැයි අපි අවධාරණයෙන් කියමු. මාස ගණන් විලිවැද අමාත්‍ය මණ්ඩලයෙන් අනුමත කළ බවට ප්‍රකාශ කෙරෙන වර්තමාන ප්‍රතිසංස්කරණ සැකසීම පවා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියකින් තොරව හදා ගත්තාවූ අංක ගණිතමය සූත්‍රයකි.ඒවා පාර්ලිමේන්තුවේ පක්ෂ



නායකයින් හා ඔවුන්ගේ හිතවතුන් කිහිප දෙනෙකුට සීමාවූ රහස්‍ය සාකච්ජා විය. පාර්ලිමේන්තුවේ මන්ත්‍රී සංඛ්‍යාව 225 සිට ඉහළට තීන්දු කෙරෙන්නේ ජනතා නියෝජනය ශක්තිමත් කිරීමේ වුවමනාව අනුව නොවේ. ඒ ගැන සඳහන් නොකරන ආණ්ඩුවේ පා පුවරුවට නැග ගත්තවුන් ආසන සංඛ්‍යාව ගැන කියන්නේ එය කුඩා පක්ෂ වලටත් කාන්තා හා තරුණ නියෝජනයටත් ඉඩදීමට වැඩි කිරීමක් බවය.

ඒ අනෙක් බරපතල මුසාවය. කාන්තා හෝ තරුණ නියෝජනය තීන්දු වන්නේ ආසන සංඛ්‍යාව අනුව නොව දේශපාලන පක්ෂ කාන්තාවන්ට හා තරුණයන්ට දේශපාලනය කිරීමට කෙතරම් ඉඩ දෙන්නේද යන්න අනුව පමණී. ප්‍රධාන ධාරාවේ ධනපති දේශපාලන පක්ෂ එවැනි නිදහසක් නොදෙන බව ඉතා පැහැදලිය. කුඩා පක්ෂ සංකල්පය අනුපාත ක්‍රමයට මාරුවීම සඳහා ජයවර්ධන ජනාධිපති ඉදිරිපත් කළ පල් බොරුවකි. මැතිවරණයෙන් මැතිවරණයට දේශපාලන පක්ෂ ලොකු කුඩා යැයි තීන්දු කරන්නේ ජන්දදායකයාය.

සුළු ජාතික ආගමික හෝ වෙනත් එවැනි විශේෂ ජන නියෝජනයක් ගැන කතාව ඇත්ත අවධාරණයක් ලැබිය යුත්තකි. ඒ නිසාම මේ මැතිවරණ ක්‍රම ප්‍රතිසංස්කරණ සාකච්ජාව පාර්ලිමේන්තුවට සීමා නොකල යුතු යැයි අපි කියමු.මේ රටේ ඕනෑම මැතිවරණ ක්‍රම ප්‍රතිසංස්කරණයක් ගැන කතා කල යුත්තේ පළාත් සභා සතු ජනතා නියෝජනයද හවුල් කර ගනිමින්ය.

පළාත් සභා දැන් ආණ්ඩු පාලනයේ දෙවැනි තට්ටුව වන බැවිනි.මැතිවරණ ක්‍රම ප්‍රතිසංස්කරණ එළෙසින් ගෙන කතා කරන්නේ නම් සියලු සුළු ජාතික ආගමික හා වෙනත් සුළුතර ප්‍රජාවන් ප්‍රජාතන්ත්‍රවාදී නියෝජන ව්‍යුහයන්ට ඇතුලු කර ගැනීමේ වැදගත් ශිෂ්ඨ ක්‍රම ගැන කතා කළහැක. මේ කරන්නට යන්නේ ඒ කිසිත් නොවේ. මේ කරන්නට යන්නේ අවජාතක අශීලාචාර පාර්ලිමේන්තුවක ඉන්නා කණ්ඩායම් ඊළඟ මැතිවරණයෙන් තම අනාගතය සහතික කර ගැනීමේ උප්පරවැට්ටිය 20 වන සංශෝධනය ලෙසින් ජනතාවට විකිණීමය. යෝජනා කෙරෙන හා සම්මත කිරීමට අවශ්‍ය යැයි කියන්නාවූ එම 20 වන සංශෝධනය ඊළඟ මැතිවරණයට අදාල නොවන්නේ නම් මේ හදිස්සිය කුමක්දැයි අපි අසමු.

මැතිවරණයෙන් පසු පත්වන පාර්ලිමේන්තුවට මේ ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කර සම්මත කර ගැනීමේ ඇති අවුල කුමක්දැයි විමසිය යුතුය.

එනිසා ඉදිරියේද මන්ත්‍රීකම් ඇමතිකම් බලාපොරොත්තු වන දේශපාලඥයින් හා ඔවුන්ගේ පුරෝහිතයින් කිහිප දෙනෙකුට 20 වන සංශෝධනය හදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අයිතියක් නැතැයි අපි කියමු. තමන් කෙසේ නියෝජනය විය යුතුද යන්න තීන්දු කළ යුත්තේ ජන්ද දායකයන්ය. මේ සමාජයට මැතිවරණ ක්‍රමයේ වෙනස් කිරීම් පිළිබඳ හදිස්සියකින් තොර කතිකාවක් අවශ්‍යව ඇත. එසේ කිරීමට 19 වන සංශෝධනය සම්මත කිරීමේදී මෙන් කළ අන්දමට නොව මේ ප්‍රතිසංස්කරණ විශේෂයෙන් සිංහල හා දෙමළ බසින් සමාජයට ඉදිරිපත් කළ යුතුය. මෙම ගැටලුව විසඳිය හැකි වන්නේ මහජන ව්‍යවස්ථාදායක සභාවක් කැඳවා කම්කරු පංතිය ඇතුලු සමාජයේ සියලු ස්ථරයන්ට ප්‍රජාතන්ත්‍රවාදීව සාකච්ජා කිරීමට අවස්ථාව උදාකර දීමෙනි. වමේ ව්‍යාපාරය හා වෘත්තිය සමිති ඒ වෙනුවෙන් හඬනැගීමට වහාම පියවර ගත යුතුය.

2 පිටුවෙන් ....

## ආණ්ඩුව කොයිබටද ?

කම්කරු පංතියට වැටුප් වැඩි කිරීමේ පොරොන්දුවද සිදුවූයේ කොලේ වහලා ගැසීමක් ලෙසිනි. ලක්ෂ 15ක් පමණ වන රාජ්‍ය අංශයේ කම්කරුවන්ට රු 10000 /= ක් වැටුප් වැඩි කිරීමේ පොරොන්දුව පරාජිත මහින්ද රාජපක්ෂ අවසන් මොහොතේ දුන් රු 3000/= සමග එකතු කර ඇත. ලක්ෂ 70ක් පමණවන පෞද්ගලික අංශයේ කම්කරුවන්ට රනිල්ගේ විශේෂ අයවැයෙන් රු 2500/=ක් ගෙවීමට හාම්පුතුන්ගෙන් ඉල්ලීමක් කළද එය මේ දක්වා ඉටු වී නොමැත. වතුකරයේ කම්කරුවන්, නිදහස් වෙළඳ කලාපයේ කම්කරුවන් මෙම ලක්ෂ 70 ට ඇතුලත් වේ. රජයේ විශ්‍රාමිකයින්ට පොරොන්දු වූ රුපියල් 3500/= වෙනුවට ලැබුනේ රුපියල් 1000/= ක් පමණි. අනෙක් රු 2500/= මහින්ද රාජපක්ෂගේ නමට බැරවිය.

දූෂිත මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම දින 100 පොරොන්දු අතර ප්‍රමුඛත්වයට පත් තවත් පොරොන්දුවකි. සෑම මැතිවරණ කොට්ඨාශයකටම එක් මන්ත්‍රීවරයෙකු පත්වීම සහතික කරමින් මනාප ක්‍රමය අහෝසි කරන බව එහි සඳහන් විය. එහෙත් එය යථාර්තයක් වන ලකුණු පෙනෙන්නට නැත. එජාපය හා ශ්‍රීලනිපයේ දේශපාලන කඹ ඇදිල්ලක් බවට 20 වන ව්‍යවස්ථා සංශෝධනය පත්ව තිබේ. මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම පිළිබඳ කථාව දිනපතා පුවත් මවන මාතෘකාවක් බවට පත්ව ඇත්තේය. කාලය ගෙවී යමින් පවතී. දින 100 ගැන හෝ ඉටු කෙරුන නොකෙරුන පොරොන්දු ගැන දැන් කථාවක්වත් නැත. සමාජය එක තැන පල් වෙමින් පවතින අතර රටේ ආර්ථික වර්ධනය ඇන හිටින තත්වයකට ඇද වැටී ඇත. රජයේ සේවකයින්ගේ වැටුප් ගෙවා ගැනීම ඇතුලු එදිනෙදා රාජ්‍ය වියදම් පියවා ගැනීම පිළිබඳ ප්‍රශ්නයකට ආණ්ඩුව මුහුණ දෙමින් සිටී.

මේ අතර පාර්ලිමේන්තුව එකම විහිලු මඩුවක් බවට පත්ව ඇත. රට පාලනය කරන රනිල් අගමැති ධූරය දරණ එජාප ආණ්ඩුවට පාර්ලිමේන්තුව තුල බහුතර බලයක් නොමැතිය. ඒ අතර ශ්‍රීලනිපය නායකත්වය දෙන විපක්ෂය සතිපතා ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ට හා අගමැති රනිල්ට විරුද්ධව විශ්වාස භංග යෝජනා ඉදිරිපත් කරමින් සංදර්ශණ පවත්වති. දින 100 අවසන් වූ අප්‍රේල් මස 24 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හරින බවට මෛත්‍රිපාල ජනාධිපතිවරයා ජනතාවට පැහැදිලි පොරොන්දුවක් දුන්නේය. දැන් එය නොතකා මෛත්‍රී පාලනය ඉබා ගාතේ ඇදි ඇදී යයි.

මෙම පසුබිම තුළ උදාවී තිබෙන ආරාජිකත්වය ඉදිරියේ වම හා කම්කරු පංතිය ශිෂ්‍ය හා තරුණ ව්‍යාපාරය සමග වගකීම් සිය දෑතට ගෙන කටයුතු කිරීමට අසමත් වුවහොත් ඇති විය හැකි තත්වය භයානක විය හැකිය. ධනපති පංතිය ඇතුලු ප්‍රතිගාමී හා ජාතිවාදී බලවේග ඔවුනට ලැබෙන අවස්ථාව අත්හැර දැමීමට සූදානම් නැත. මෙය පංති බලවේග දෙකක් අතර වන සටනකින් අනාගතය තීන්දු කිරීමේ ගැටලුවක් දක්වා වර්ධනය වී හමාරය. පෑගෙන පීඩිත ජනතාවගේ පැත්තෙන් මෙම අභියෝගය හඳුනා නොගෙන සාමාන්‍යයෙන් එදි නෙදා කටයුතු කරන ආකාරයට හැසිරීම වහා වෙනස් කළ යුතුව ඇත. වමේ නමින් පෙනී සිටින ජනතා විමුක්ති පෙරමුණ උණු ජලයේ පිණුම් ගසන කකුලුවන් මෙන් පාර්ලිමේන්තුවේ ආසන ගනනක් කෙසේ හෝ දිනා ගැනීමේ බංකොලොත් මාවතට වැටී අවසානය. ජවිපෙ නායකත්වය ධනපති පංතියේ අදිසි බලවේග විසින් මෙහෙය වන රූකඩ බවට පත්ව හමාරය.

මහින්දගේ ඒකාධිපති වියරුවට එරෙහිවූ ජන කොටසක් මෛත්‍රීගෙන් විසඳුමක් බලාපොරොත්තුවෙන් මායා ලෝකයක පැටලී ඇත. මෙම තීරණාත්මක මොහොතේ සැබෑ වමේ බලවේග වල අභියෝගය වන්නේ මේ දැවැන්ත කාර්‍යයට අත ගැනීමයි. සාපේක්ෂ වශයෙන් කුඩා පක්ෂ හා බලවේග වශයෙන් සිටියද මෝදුවන සමාජ අර්බුදයන් වලදී දැවැන්ත කාර්‍යභාරයක් වමේ බලවේග වලට ඉටු කළ හැකි බවට පංති අරගලයේ ඉතිහාසය කියා දෙනු ලබන පාඩමයි. ඔබ අපි මුහුණ දෙන්නේ ඒ හා සමාන තත්වයකටය. සමාජවාදය වෙනුවෙන් පෙනී සිටින එම බලවේගයන්ට උතුරේ පීඩිත දෙමළ ජනතාව හා දකුණේ කම්කරු පංතිය ඇතුලු පීඩිත ජනතා බලවේග වලට නායකත්වය සැපයීම සඳහා ක්‍රියාකාරී වැඩ පිළිවෙලක් වහා ගොඩනගා ගත යුතුව ඇත. එක්සත් සමාජවාදී පක්ෂය අද රට තුළ පවතින එකම නිර්ව්‍යාජ වමේ පක්ෂය ලෙස ඒ දැවැන්ත කර්‍යභාරය තම දෙවුර මත ගැනීම සඳහා සියලු උත්සාහයන් දරමින් සිටී. ඒ සඳහා පංති සටන්කාමින් හා එඩිතරයින් සමග විවෘත සාකච්ජාවක් ආරම්භ කර ඇති බව ද ඒ සඳහා පෙරමුණ ගැනීම ඔබේ වගකීම බවද අවධාරනය කරන්නෙමු.

**-තාරක-**




අලුත් ගම දර්ගා නගරයේ සිදු වූ ඛේදවාචකයට මේ වන විට වසරක් ගෙවී යයි. මුස්ලිම් ජාතික තරුණයින් තිදෙනෙකු මෙහිදී වෙඩි තබා ඝාතනය කෙරින. මෙවා වෙඩි තැබීමකින් සිදු වූ මරණ නොවන බව පෙන්වීමට මහින්ද හා ගෝඨාගේ ආණ්ඩුව නොකළ දෙයක් නැති තරම්ය. අවසානයේ එය මිනිමැරීමක් බව අධිකරණය තීන්දු කරන ලදි.





මහින්ද හා ගෝඨාභය දැන් ගෙදර ගොස්ය. මෛත්‍රී - රනිල් බලයට පැමිණ ඇත. මෛත්‍රී එම දිනවල (පසු ගිය ජුනි 15) මහින්ද යටතේ ඇස් කන් නොමැතිව ඇමති ධූරයේ සිටියහ. එහෙත් රනිල් දර්ගා නගරයේ ඝාතන ගැන නිතර විරෝධය දැක්වූහ. එහෙත් දැන් ඔහුද නිහඬව බලා සිටින සැටියෙකි.

මෙම නිහැඬියාව බිඳීම සඳහා එක්සත් සමාජවාදී පක්ෂය සංවිධානය කළ සම්මන්ත්‍රණයක් පසු ගිය ජුනි 12 මරදාන සමාජය හා සාමයික කේන්ද්‍රයේදී පැවැත්වින. එම සම්මන්ත්‍රණය අමතා රතු තරුව කර්තෘ නීතිඥ ශ්‍රිනාත් පෙරේරා පළාත් සභා මන්ත්‍රී මුජිබර් රහුමාන් නීතිඥ නාමල් රාජපක්ෂ හා සත්‍යවේල් පියතුමා දෙසුම් පවත්වන ලදි. මුලසුන සිරිතුංග ජයසූරිය සහෝදරයා විසින් උසුලන ලදි.

# නිමක් නුදුටු වමේ පාවාදීම් එදා සහ අද

-සිරිතුංග ජයසූරිය-

**1935 දෙසැම්බර් 18 වනදා ලංකා සමසමාජ පක්ෂය බිහිවීම ලාංකික දේශපාලන ඉතිහාසයේ දැවැන්ත සිදුවීමක් විය. ධනපති පංතිය පෙරලා දමා කම්කරු පංති නායකත්වයෙන් සමාජවාදී ආණ්ඩුවක් ගොඩනගා ගත යුතුය යන අදහස පළමු වතාවට මෙරට දේශපාලන භූමිය තුල ජනිත වුයේ එමගිනි. එය අනිවාර්යයෙන්ම ලෝක සමාජවාද ව්‍යාපාරය සමග අත්වැල් බැඳගත් ජාත්‍යන්තරවාදී ව්‍යාපාරයක කොටසක්ද වීම වැදගත් පියවරක් විය.**

ලංකාවේ එවකට සිටි ධනපති පංතියේ නියෝජිතයින් බ්‍රිතාන්‍ය සුදු අධිරාජ්‍යවාදීන් මත යැපෙන කොම්ප්‍රදෝරු පිරිසක් ලෙස කටයුතු කරමින් සිටියහ. 1927දී ඩොනමෝර් කොමිෂම් සභාව පිහිටුවා ජනතාවට සර්වජන ඡන්ද අයිතියදීම පිළිබඳ ප්‍රශ්නය මතුවු අවස්ථාවේදී ධනපති පංතියේ නියෝජිතයින් වු ඩි"එස් සේනානායක හා බාරොන් ජයතිලක වැනි අය ඡන්ද අයිතිය දීමට විරුද්ධව කරුණු දක්වන තැනට පත්ව සිටියහ. එම පසුබිම තුළ ඩොනමෝර් කොමිසම ඉදිරියේ ජනතාවගේ ඡන්ද අයිතිය ලබා ගැනීම සඳහා කරුණු ඉදිරිපත් කළේ එවකට කම්කරු සංගමයේ නායකයා ලෙස කටයුතු කළ ඒ ඊ ගුණසිංහ පමණී. ලංකාවට නිදහස ලබා ගැනීමේදී පවා ධනපති නායකයින්ට තිබුණේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගෙන් ලැබෙන දෙයක් යටහත් පහත්ව ලබා ගැනීමේ නිවට නියාලු ප්‍රතිපත්තියකි.



## වමේ පක්ෂ දෙකක්

එසේ වුවද වමේ ව්‍යාපාරය ආරම්භයේ සිටම අප රටට නිදහස දිනා ගැනීම හා අධිරාජ්‍ය විරෝධි අරගලය ගැන ජනතාව දැනුවත් කරමින් අරගලයන් වල නිරත විය. 1939 දෙවන ලෝක යුද්ධය ආරම්භවීම සමග අධිරාජ්‍යවාදී යුද්ධය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ස්ථාවරය ගැන න්‍යායික විවාදයක් සමසමාජ පක්ෂය තුළ මතුවිය. ඒ විවාදය සමග තුන්වන ජාත්‍යන්තරය අනුමනය කරන ක්‍රියාමාර්ගය සම්බන්දයෙන්ද තියුණු විවාදයක් මතුවිය. ජාත්‍යන්තර කම්කරු පංති ව්‍යාපාරයේ උන්නතිය වෙනුවෙන් 3 වන ජාත්‍යන්තරය ක්‍රියා නොකරන බැවින් එය සමග පවත්වන සම්බන්ධතාවලින් ඉවත් විය යුතු බවට වන යෝජනාවක් සමසමාජ පක්ෂයේ මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් ඉදිරිපත් විය. එම යෝජනාවට විරුද්ධව ඡන්දය පාවිච්චි කළ එස්. ඒ වික්‍රමසිංහ හා එම්. ජී මෙන්ඩිස් ඇතුලු 5 දෙනෙකු සමසමාජයන් නෙරපා දමනු ලැබූ අතර ඉන් අනතුරුව එම කණ්ඩයම පසු කලෙක ලංකා කොමියුනිස්ට් පක්ෂ බිහිකිරීමට කටයුතු කරන ලදී.



න්‍යායික වශයෙන් වෙනස්කම් පක්ෂ දෙක අතර පැවතියද ආරම්භක අවධියේදී සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය කම්කරු පංතියේ හා පීඩිත ජනතාවගේ අයිතින් දිනා ගැනීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලැබීය. කම්කරු පංති ව්‍යාපාරයට නායකත්වයදුන් වමේ ව්‍යාපාරය 1956දී බණ්ඩාරනායකට ආණ්ඩුවක් (එජාපයට එරෙහිව) ගොඩනගා ගැනීමට සහයෝගයදීමට ගත්තාවූ තීන්දුව සමග ස්වාධීන කම්කරු පංති අරගලයේ ගමන්මග පාවාදීම සිදු කෙරින. ජනප්‍රිය ජාතිවාදී බලවේගයක මුහුණුවරින් බලයට පැමිණි ධනපති බණ්ඩාරනායකට අනුකූලතා සහයෝගය නමින් (Responsive co - operation) ධනපති සභාග දේශපාලනයට අවතීර්ණවීමේ පළමු පියවර තැබිණ. අනාගත සභාග දේශපාලන ක්‍රියාවට ඇතුල්වීම සඳහා ලසසප නායකත්වය එදා හවුල් දේශපාලනය ආරම්භ කළේ අනුකූලතා සහයෝගය යන නමිනි. එසේම 2001 වසරේදී ජනතා විමුක්ති පෙරමුණ ධනපති හවුල් දේශපාලනයට ඇතුල්වූයේ ඊනියා පරිවාස ආණ්ඩුව යන නමින්ය. මේ වන විට එම කඩතුරා සියල්ල හෙළිදරව්වී අවසානය. බණ්ඩාරනායකගේ ආණ්ඩුව හුදෙක් ධනපති ආණ්ඩුවක් පමණක් නොවූ අතර එය සිංහල පමණක් එකම රාජ්‍ය භාෂාව වියයුතු යන ජාතිවාදී දේශපාලන කරලියට ගෙනා දේශපාලනයද විය. අද දක්වා දිග හැරෙමින් පවතින උග්‍ර සිංහල ජාතිවාදී දේශපාලනය ඒ හරහා ගලා එන්නකි.

## වම ජාතිවාදයට යට වෙයි

ධනපති පංතිය (ශ්‍රීලනිපය) සමග සභාග දේශපාලනයට ගමන් කිරීම සමග සමසමාජ හා කොමියුනිස්ට් පක්ෂ ධනපති විරෝධි ස්වාධීන පංති සටන් ක්‍රියාමාර්ගය අත්හැර දැමුවා පමණක් නොව සිංහල ජාතිවාදී දේශපාලනයද වැළඳ ගැනීමට සිදුවිය. පළමු වරට ලංකාවේ සමස්ථ වෘත්තිය සමිති ව්‍යාපාරය 1964 දී ඉල්ලීම් 21 වටා එකම සටන් පෙරමුණකට අත්වැල් බැඳගත්හ. එහෙත් වැඩි කාලයක් යන්නට මත්තෙන් ඉල්ලීම් 21 පාවාදී හවුල් ආණ්ඩුවකට ඇතුල්වීම සමසමාජ නායකත්වය ගත්තාවූ තීන්දුව මරණීය පාවාදීමක් විය. 1968 ඩඩ්ලි - චෙල්වනායගම් ගිවිසුමට විරුද්ධව ශ්‍රීලනිපය සමග ඩඩ්ලිගෙ බඩේ මසල වඩේ කියන තැනට පත්ව පෙළපාලි යෑම දක්වා වමේ නායකයෝ ජාතිවාදී දේශපාලනය කරපින්නා ගත්හ. 1972දී කොල්වින් ආර්. ද සිල්වාගේ නායකත්වයෙන් සම්පාදනය කෙරුන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බෞද්ධාගම මුල්තැන දියයතුය යන්න පවා ඇතුලත් කිරීම දක්වා සමසමාජ නායකයෝ පිරිහී තිබුණි. සමසමාජ නායකයින් ධනපති ශ්‍රීලනිපය සමග සභාග දේශපාලනය වැළඳ ගැනීම සමග ජාතික ප්‍රශ්නය සම්බන්දයෙන් දෙමළ ජනතාවගේ අයිතින් ආරක්ෂා කිරීම වෙනුවෙන් පෙනී සිටීම පවා අත්හැර දමන ලදී . 1972 ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය වෙත පෙඩරල් පක්ෂය විසින් ඉදිරිපත් කළ යෝජනා 6 සැළකීමට නොගෙන ප්‍රතික්ෂේප කිරීම දක්වා සමසමාජ කොමියුනිස්ට් නායකයෝ නිවට විය. 56 බණ්ඩාරනායක සමග නිතරඟ ගිවිසුමක පදනමින් ආරම්භ කෙරුන සභාග හවුල් දේශපාලනය 1960 1964 1970 - 1994 හරහා 2005 දී මහින්ද රාජපක්ෂ දක්වා පංති සහයෝගීතාවාදී ගමනේ දිගු ගමනක නිරත විය.

## නව වමක ආරම්භය

1970දී ශ්‍රීලනිපය සමග දිගුකාලීන හවුල් ආණ්ඩුවක ඇමතිවරුවීමේ ප්‍රතිපලයක් ලෙස වැඩ වර්ජන කඩා දමමින් කම්කරු පංති ව්‍යාපාරයට එරෙහිව කටයුතු කිරීම දක්වා වමේ නායකයින් ගමන් කරනු ලැබීය. මේ සමග දකුණේ මෙන්ම උතුරේද වමේ නායකත්වය කෙරෙහි විශ්වාස තබා සිටි පීඩිත ජනතාව ඇතුලු තරුණ ව්‍යාපාරය ස්වාධීන ගමන් කිරීමට පෙළඹීය. දකුණේ ජනතා විමුක්ති පෙරමුණේ බිහිවීමද නව සමසමාජ පක්ෂයේ (මුල්කාලීනව වාම සමසමාජය ලෙස) ආරම්භයද සනිටුහන් වන්නේ එලෙසය. උතුරේ පොලොට් (PLOTE) කොටි සංවිධානය (LTTE) ටෙලෝ හා (EPLRF) yd(EROS) යන සංවිධාන ගනනාවක් දකුණට සමගාමීව බිහිවිය.



නාගරික කම්කරු පංති ව්‍යාපාරය වෙනුවට ග්‍රාමීය කුල පීඩිත ජනතාව හා සිංහල බෞද්ධ සංස්කෘතිය පදනම්ව ව්‍යාපාරයක් ලෙස ජවිපෙය සීග්‍රයෙන් ව්‍යාප්ත වන්නට විය. විජේවීර ඇතුලු ජවිපෙ ආරම්භක නායකයින් පැරණි වමේ නායකයින් කෙරෙහි දැක්වූයේ මාක්ස්වාදය මත පදනම්වූ න්‍යායික විවේචනයකට වඩා තරුණයින් කුපිත කරවන වෛරී භාෂාවකි. උදාහරණයක් ලෙස ජවිපෙය සමසමාජ හා කොමියුනිස්ට් පක්ෂ වල නායකයින් හැඳින්වූයේ රදළ පවුල් පසුබිම් වලින් පැවත එන විදේශිය අධ්‍යාපනය ලත් සුළු ධනපති කොටස් වශයෙනි. ධනපති පවුල් පසුබිම් වලින් පැවත එන මාක්ස්වාදයේ ආරම්භකයින් වන මාක්ස් හා එංගල්ස් ගැන ජවිපෙ නායකයින් එවකට කිව්වේ කුමක්ද යන්න තේරුම් ගැනීම අපහසුය.

වමේ පැරනි නායකයින්ගේ ප්‍රතිසංස්කරණවාදී පිරිහීමට හා ජාතිවාදී දේශපාලනයට එරෙහිව ගැඹුරු හැදෑරීමකින් තොරව වමේ ව්‍යාපාරයේ නායකයින් ගැන විජේවීර විසින් ප්‍රචලිත කළ හුදු වෛරී දේශපාලනය (න්‍යායික විවේචනයකට වඩා) අදත් ජවිපෙය තුල දකින්නට ඇත්තේ මෙබැවිනි. ජවිපෙය කිසිදිනක පැරනි වමේ පක්ෂ ඇතුලු සෙසු වමේ පක්ෂ සමග එක්සත් ක්‍රියාකාරත්වයකට කිසිදිනක ගමන් නොකරනුයේ එම වෛරී දේශපාලනය නිසාය. 1988 - 89 කාලයේ භීෂණ සමය තුළ ප්‍රකට කම්කරු නායකයින්වූ එල් ඩබ්ලිව් පණ්ඩිත ජෝර්ජ් රත්නායක ඇතුලු වමේ ක්‍රියාකාරීන් විශාල සංඛ්‍යාවක් ඝාතනය කිරීමට සමත් කාලකන්නි මානසිකත්වයක් දේශප්‍රේමී ව්‍යාපාරයට ඔබ්බවා තිබුනේද එම වෛරී දේශපාලනය නිසාවෙනි.



## ජවිපෙ පරීක්ෂණයට ලක්වෙයි

ජවිපෙ ආරම්භයේ සිට 1994 දක්වා විවෘත දේශපාලනයේ නිරතව සිටියේ ඉතා ටික කාලයකි. 78 - 83 දක්වා කාළය තුළදී විජේවීර ජනාධිපතිවරණය තරඟ කළ අතර ජේ ආර්ගේ ඊනියා සංවර්ධන සභා ඡන්දයට ජවිපෙ ඉදිරිපත් විය. 1989 විජේවීර ඝාතනය කිරීමෙන් අනතුරුව 1994 දී ජවිපෙය ආරිය බුලේගොඩගේ ප්‍රගතිශීලි පෙරමුණෙන් පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් විය. ඉන් අනතුරුව පාර්ලිමේන්තු දේශපාලනයට අවතීර්ණවීම සමග ජවිපෙය නැවත නැවත තියුණු පරීක්ෂණයන්ට භාජනය විය. පළමුව චන්ද්‍රිකා ලවා විධායක ජනාධිපති ක්‍රමය අහෝසිකර ගැනීම සඳහා ඇය ජනාධිපතිධුරයට පත් කිරීමේ ලාමක ක්‍රියාව (මෙය 1952 සමසමාජය බණ්ඩාරනායකට අනුලතා සහයෝගය දැක්වීමේ ආරම්භක ක්‍රියාව බඳු එකක් විය) සමඟ ධනපති හවුල් දේශපාලනයට ක්‍රමයෙන් ඇදී යන්නට වුහ. මෙය චන්ද්‍රිකා 2004 දී ගොඩනගාගත් පරිවාස ආණ්ඩුව නමින් වු ධනපති හවුලෙන් නොනැවතී 2005 දී මහින්ද රාජපක්ෂ සමග ගිවිසුම් සහගත ධනපති හවුලක් දක්වා ජවිපෙය ගමන් කළේය. එය බිඳවැටුනද ජවිපෙ පංති සහයෝගීතාවාදී දේශපාලන ගමන අවසන් වුයේ නැත. 2010දී හිටපු යුද්ධ හමුදාපති සරත් ෆොන්සේකා ජනාධිපති කරවීම සඳහා කර ගැසීය (රටේ වාසනාවකට ෆොන්සේකා ජය නොලැබූ අතර එසේ ෆොන්සේකා ජනාධිපතිවුයේ නම් ජවිපෙට නැවත වතාවක් ජිවිත වලින් වන්දි ගෙවීමට සිදුවනු නොඅනුමානය.)

වමේ නාමයෙන් ජවිපෙය මේ වන විට රඟ දක්වමින් සිටින අවසන් ජවනිකාව මෛත්‍රී - රනිල් ආණ්ඩුවේ විධායක සභාවට ඇතුලත්වී ධනපති පාලනය පිළිසකර කර ගෙනයාමට දරණ උත්සාහයයි. ජවිපෙ නායකයාව සිටි සෝමවංශ පක්ෂයෙන් ඉවත් වන්නේ මෙම සන්දර්භය තුලය. සෝමවංශ මුලසිට මේ දක්වාම ධනපති පංතිය සමග පංති සහයෝගීතාවාදීව ගමන් කළ යුතුය යන අදහස වෙනුවෙන් පෙනී සිටි බව නොරහසකි. ගැඹුරින් තේරුම්ගත යුතු ප්‍රශ්නය වන්නේ උපායික වශයෙන් වෙනස්කම් පැවතියද අනුරකුමාර ඇතුලු වර්තමාන ජවිපෙ නායකත්වය හා සෝමවංශ අතර මූලධාර්මික වෙනස්කමක් ඇත්තේ නැති බවය. පැරනි වමේ පාවාදීම්වලට එරෙහිව ගොඩනගන ලද ජවිපෙය මේ වන විට ගත කරමින් සිටින ප්‍රතිසංස්කරණවාදී ධනපති හවුල් දේශපාලනය ජවිපෙ අනුගාමිකයින් හමුවේ විවෘත සංවාදයකට ගෙනයාම වැදගත් වන්නේ ඔවුන් තවමත් සමාජවාදය කෙරෙහි විශ්වාස තබමින් කටයුතු කරන සටන්කාමී පිරිසක් බැවිනි.

## නසසපයේ විනාශය

එතරම් දීර්ඝව සාකච්ජා කලයුතු නැතත් වර්තමාන වමේ ව්‍යාපාරය ගැන සලකාබැලීමේදී වික්‍රමබාහු නායකත්වය දෙන නව සමසමාජ පක්ෂය ගැන සඳහනක් කළ යුතුව ඇත. නසසපය බිහිවුයේ ලංකා සමසමාජ පක්ෂය තුළ කම්කරු පංති ඉදිරි ගමන සඳහා පැවැති ඉතා දීර්ඝ න්‍යායාත්මක විවාදයක ප්‍රතිපලයක් වශයෙනි පැරණි වමේ නායකයින්ගේ ඉතිහාසය හෝ පවුල් පදනම් ගැන කෙරෙන සාකච්ජාවකට වඩා ජාත්‍යන්තර පරිමාන සමාජවාදී ව්‍යාපාරයේ අත්දැකීම් මත සමසමාජ පක්ෂය අනුගමනය කරන පංති සහයෝගීතාවාදී දේශපාලනය ගැන කෙරුන පොහොසත් විවාදයක් විය. ඒ හරහා සමසමාජයේ ප්‍රාදේශීය නායකයින් පමක් නොව කම්කරු පංති ව්‍යාපාරයේ අතිවිශාල පිරිසක් මතවාදීමය ලෙස විප්ලවවාදී ක්‍රියාමාර්ගය වෙත දිනා ගැනීමට වාම සමසමාජ කණ්ඩායමට හැකි විය. නව සමසමාජය නමින් මේ වන විට පෙනී සිටින සංවිධානයේ මූලික අත්තිවාරම වුයේ කම්කරු පංති නායත්වයෙන් යුත් බොල්ෂේවික් පන්නයේ ජාත්‍යන්තරවාදයත් දේශිය වශයෙන් ධනවාදයට ධනපති හවුල් සභාග දේශපාලනයට හා ජාතිවාදයට විරුද්ධව විප්ලවාදී වැඩ පිළිවෙලක් වෙනුවෙන් නිර්ධන පංති බලවේග සංවිධානය කිරීමය.

7 පිටුව බලන්න....

# ත්‍රස්තවාදී විබ්‍රමය හා මාක්ස්වාදය



*ඒ අනුව සමාජවාදීන්ගේ හා මාක්ස්වාදීන්ගේ මෙන්ම පොදුවේ කම්කරු ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය වන්නේ කම්කරු පංතිය සතුව පවත්නා දැවැන්ත බලය පිළිබඳව වැඩ කරන ජනතාව සංවේදී කරලීමය. ඔවුන් නැවත නැවත දැනුවත් කිරීමය. ධනපති සමාජය තුල ඇති වඩාත්ම ශක්තිමත් සංවිධිත ශක්තිය වන්නේ කම්කරු පංතියයි.*



පසුගිය කාලය තුල ලොව මවිතයට පත්කළ 2001 සැප්තැම්බර් 11 වෙනි දින ඇමරිකාවේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයට හා පෙන්ටගනයට ප්‍රහාර එල්ල කිරීම හෙලා දැකීමට අපි නොපැකිළවම ඉදිරිපත් විය. ඒ සමගම ත්‍රස්තවාදයට එරෙහිව යුද්ධය නමින් දියත් කරනු ලබන සංහාරයට ධනවාදී පාලකයින්ට අපි කිසිදු ආකාරයක සහයෝගයක් නොදැක්වීමු. එමෙන්ම නව යටත් විජිතවාදී ලෝකයේ අනාරක්ෂිත අහිංසක ජනතාවන්ට එරෙහිව සිදු කරන රාජ්‍ය ත්‍රස්තවාදයටද අපි කිසි ලෙසකින්වත් සහයෝගයක් නොදක්වන්නේය.

අපගේ මෙම ප්‍රවේශයට සියල්ලන් විසින් හෝ අනෙකුත් සමාජවාදී කියා ගන්නා කණ්ඩායම් වල පිරිස් විසින් හෝ එකඟත්වය දක්වන්නේ නැත. සමහරු වක්‍රෝත්තියෙන් යුතුව තම ස්ථාවරය පලකරන අතර තවත් පිරිස් මෙම ප්‍රහාර හෙලා දැකිම ප්‍රතික්ෂේප කරති. මෙම ආකල්ප ඉතා ගැඹුරු ලෙසම වැරදි සහගතය. එමෙන්ම එවැනි ස්ථාවරයක් හේතුවෙන් වැඩ කරන ජනතාව අතරින් වැඩි පිරිසක් පංති ව්‍යාපාරයෙන් ඈත්වීමටත් ධනවාදීන්ගේ ග්‍රහනයට හා ඔවුන්ගේ යුද සැලසුම් වලට අනුගත වීමටත් හේතු වනු ඇත. ඊටත් වඩා මෙම පුද්ගල ත්‍රස්තවාදී ක්‍රම වලට සමාජවාදී ප්‍රතිපත්ති අනුව විවේචනය කිරීමේ නිදහසට එය ප්‍රබල පහරක් වනු ඇත.

## රුසියානු අත්දැකීම්

ඓතිහාසිකව මාක්ස්වාදය සෑම විටම පුද්ගල ත්‍රස්තවාදී ක්‍රමවලට විරුද්ධ විය. 1938 වසරේදී බොල්ෂේවික්වාදය පිළිබඳ තම ආකල්ප කැටි කොට දක්වන ලියෝන් ට්‍රොට්ස්කි මෙසේ පවසා ඇත. ඓතිහාසිකව රුසියාවේ සියළු මාක්ස්වාදීන්ගේ මුලාරම්භය සිදු වුයේ ත්‍රස්තවාදයට එරෙහිව පැවති අරගලය හරහාය. තවදුරටත් සිය අදහස් පල කරන ට්‍රොට්ස්කි රුසියාවේ අවුරුදු දහසක් කාලයක් තුල පැවති සාර්වාදී ඒකාධිපති පාලනය තුල තරුණ පිරිස් දැක්වූ මුල්ම ප්‍රතික්‍රියාව වුයේ පලිගැනීමයි. ඇමතිවරු ඝාතනය කිරීමයි. එහෙත් අපි (සමාජවාදී හා මාක්ස්වාදී බොල්ෂේවික්වරු) ඔවුනට මෙසේ කීවෙමු. අපගේ පලිගැනීම වන්නේ ත්‍රස්තවාදී ක්‍රම වලින් නොවේ. ඇමතිවරු ඝාතනය කිරීම නොවේ. අපගේ පලිගැනීම විය යුත්තේ පුද්ගලයින්ට එරෙහිව නොව කෲර පාලන රටාවක් ඇතිකල සාර්වාදය නැමැති දේශපාලනය සමුල ඝාතනය කිරීමය. මෙසේ පවසන ලද්දේ කම්කරු පන්ති ව්‍යාපාරය බොල්ෂෙවික් හා මෙන්ෂෙවික් යන ප්‍රබල කණ්ඩායම් දෙකක් ලෙස නැගී එන තත්වය තුලදිය. එම ව්‍යාපාර දෙක මුහුට මුහුණ ලා නැගී සිටින්නේ රුසියාවේ පැවති බලගතු පක්ෂ වන නරෝද්යා වොල්යා (ජනතාවගේ අභිමතය) හා සමාජ විප්ලවවාදීහු යන පක්ෂවලටය. මෙම පක්ෂ තම උපක්‍රම පදනම් කොට තිබෙන්නේ ත්‍රස්ත ක්‍රියා මතය. මෙම ක්‍රම මගින් බුද්ධිමතුන් හුදකලාව සිටින කම්කරුවන් හා ගොවින් සහිත එක්තරා තරුණ පිරිසකට බලපෑම් කල හැකි විය. එහෙත් එසේ කල හැකි වන්නේ සංවිධිත කම්කරු පන්ති ව්‍යාපාරය තවදුරටත් වර්ධනය නොවන්නේ නම් හා එය දේශපාලන භූමිය මත පූර්ණ ලෙස දිස් වන්නේ නැතිනම් පමනකි.

විශේෂයෙන්ම කම්කරු ජනතාවගේ වේදිකාවට 1905 වසරේදී රුසියානු විප්ලවය ආගමනය වීමත් සමගම මෙම ක්‍රම පසුපසටම තල්ලුවි ගියේය. එහෙත් වර්ෂ 1907 දී විප්ලවය පරාජයට පත්වූ විට මෙසේ පසුපසට තල්ලුවී ගිය ත්‍රස්ත ක්‍රම යලිත් මතුවන්නට පටන් ගත්තේය. සාර්වාදී රාජ්‍ය යාන්ත්‍රණය මගින් සිදුකල ඝාතන වධහිංසා හා සිරගත කිරීම් වලට ප්‍රතික්‍රියා වශයෙන් මේවා සිදුවිය.

එම අවස්ථාවේදී වුවද එවැනි ත්‍රස්ත ක්‍රම වලට බොල්ෂේවික්වරු තරයේම විරුද්ධ වුහ.

ඇමතිවරයෙකු ඉවත්කිරීම හෝ ආණ්ඩුවක් වෙනස් කිරීම වෙනසක් ඇතිවීමට ප්‍රමානවත් නොවන්නේය. එපරිද්දෙන්ම යම් ධනපති නියෝජිතයකු ඝාතනය කිරීමෙන් හෝ ඔහුට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීමෙන් නැතිනම් අධිරාජ්‍යවාදී හෝ ධනවාදී කණ්ඩායමක් විනාශ කිරීමෙන් ධනේශ්වර රාජ්‍ය පද්ධතිය අස්ථාවර කල හැකි බවට හෝ පරාජය කල හැකි බවට ත්‍රස්තවාදී ක්‍රම භාවිතා කරන කණ්ඩායම් විශ්වාස කරති. කෙසේ වුවද එසේ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් අභිමිවු පුද්ගලයන් සඳහා අවශ්‍ය තරම් ආදේශකයින් සොයා ගැනීමට ධනවාදීන්ට කිසිම ගැටලුවක් මතු වන්නේ නැත“ මහජන ව්‍යාපාර අතිවිශාල රැස්වීම් උද්ඝෝෂන වර්ජන මහා වැඩ වර්ජන ආදිය මගින් හාම්පුතුන් පරාජය කිරීමට හා ධනවාදයට එරෙහිව සටන් වදින අතර පුද්ගල ත්‍රස්ත ක්‍රියාවන්ට සමාජවාදීන් හා මාක්ස්වාදීන් එකඟ නොවන්නේ එය පංති සටනට බදාවක් වන නිසාය.

## මැද පෙරදිග හා පලස්තීනය

ඒ අනුව සමාජවාදීන්ගේ හා මාක්ස්වාදීන්ගේ මෙන්ම පොදුවේ කම්කරු ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය වන්නේ කම්කරු පංතිය සතුව පවත්නා දැවැන්ත බලය පිළිබඳව වැඩ කරන ජනතාව සංවේදී කරලීමය. ඔවුන් නැවත නැවත දැනුවත් කිරීමය. ධනපති සමාජය තුල ඇති වඩාත්ම ශක්තිමත් සංවිධිත ශක්තිය වන්නේ කම්කරු පංතියයි. එමෙන්ම සැබෑ සමාජයීය හා දේශපාලන වෙනසකට මුල පුරන්නේ කම්කරු පංතිය පමුඛ මහා ජනතා ක්‍රියාකාරිත්වයෙන් බව මාක්ස්වාදීහු දැඩිව අවධාරණය කරති.

ත්‍රස්තවාදී ක්‍රියාවල අරමුණ කුමක් වුවද කම්කරු පංතිය තුල තිබිය යුතු දැනුවත් බව ඉන් යටපත් කර දමති. අධිරාජ්‍යවාදයේ හා ධනවාදයේ බලවත්කම ඉදිරියේ වැඩ කරන පන්තියේ ජනතාව නිශ්ක්‍රිය බවත් විරෝධතාවයන් නොපවත්වන බවත් යන අදහස ඔවුහු ප්‍රචාරය කරති. සිය විමුක්තිය උදෙසා කරන අරගලයේදී තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට මහා විමුක්තිදායකයෙක් හෝ කුඩා රහසිගත කණ්ඩායමක් පැමිනෙන තෙක් ජනතාව හා කම්කරු පංතිය බලා සිටිය යුතුය යන්න ඔවුන්ගේ අදහසයි. අතීතයේදී පලස්තින ජනතාවට සිය විමුක්තිදායකයින් වුයේ ජාත්‍යන්තරව හෝ රටෙන් පිට අරාබි ලෝකයේ හෝ අන් රටවල කඳවුරු බැඳ සිටින ගරිල්ලා සටන්කරුවන්ය. කෙසේ වුවද ලෙබනනයේදී 1980 වසරේදී ලත් පරාජය හා එම රට ඊශ්‍රායල හමුදා අත්පත් කර ගැනීමෙන් පසුව පලස්තින සටන්කරුවන් රටින් පිටමං කිරීම හේතුවෙන් පලස්තින ජනතාවගේ බලාපොරොත්තු සුන්වී ගියේය.

මෙවැනි තත්වයක් උදාවීම නිසා ගාසාහි බටහිර ඉවුරේ වසන පලස්තින ජාතිකයින් තුල මෙන්ම ඊශ්‍රායෙලය තුල ජීවත්වන පලස්තින ජාතිකයින් තුල මෙය අප විසින්ම කරගත යුතුය යන හැඟීමක් මතු වන්නට පටන් ගත්තේය. ඒ හේතුවෙන් ප්‍රථම ඉන්ටිෆාඩාව (පලස්තින ජාතික විරෝධය) දියත්වූ අතර ඉන්පසු මෑතකදී ඉතා දරුණු දෙවන ඉන්ටිෆාඩාවද මතුවුනි. මෙම ව්‍යාපාරය අත්‍යවශ්‍යයෙන්ම සන්නද්ධ අංශයකින් යුත් මහා ජනතා බලවේගයක් විය. හමාස් හා ඉස්ලාමීය ජිහාඩ් වැනි කණ්ඩායම් ඊශ්‍රායෙල් හමුදාවලට එරෙහිව මරාගෙන මැරෙන බෝම්බකරුවන් වැරදි සහගත ලෙස යොදා ගැනීම සිදුකෙරින. අප තේරුම් ගත යුත්තේ මෙම ක්‍රම යොදාගනු ලැබුවේ නිත්‍යානුකූලව අරගල කිරීමට හා ප්‍රජාතන්ත්‍රවාදයට විරෝධය පල කිරීමට පලස්තින වැසියන්ට තිබූ සියලු මාර්ගයන් දරදඬු ඊශ්‍රයෙල් රාජ්‍ය විසින් වසා දමනු ලැබීමත් පලස්තින ජාතිකයන් තදබල අයුරින් වධ වේදනා විඳීමත් තුලින් හටගත් ද්වේශය හේතුවෙනි. එහෙත් මෙම ක්‍රියා කලාපය දිගුකාලීනව කිසිසේත් පළදායක නොවින. සමස්ත වශයෙන් පලස්තින ජන සමූහය තවත් ඝාතනයටත් දුක් වේදනාවන්ටත් භාජනය විය. එමෙන්ම එම තත්වය දඩමීමා කර ගනිමින් කෲර ඊශ්‍රායෙල් පාලක පන්තියට රාජ්‍ය මර්ධනය තව දුරටත් මර්දනකාරී කටයුතු කිරීමට එය පිටුවහලකි.

## එදා හා අද වෙනස

අතීතයේදී තම ක්‍රමයන් වැරදි සහගත වුවද ත්‍රස්ත ක්‍රියා ජනතාවගේ විරෝදාර ලෙස සැලකුම් ලැබුහ. අහිංසකයන්ට කිසිදු ජීවිත හානියක් නොකරමින් ධනවාදයේ පුද්ගල නියෝජිතයින් වන හමුදා ජෙනරාල්වරු ඇමතිවරු පොලිස් ප්‍රධානීන් ආදී පිරිස් සමාජයෙන් ඉවත් කර දැමීමට ඔවුහු තම ජීවිතය පුදන්නට සුදානම්ව සිටියහ. අවසානයේදී සමාජයීය ජාතිකමය ආගමික හා ජනවාර්ගික මර්දනය තුලින් මතුවී එමගින්ම පෝෂණය වන නූතන ත්‍රස්තවාදී ක්‍රම ස්වභාවයෙන් වෙනස් වෙයි. 1970 ගණන්වල හා 1980 ගන්වලදී ත්‍රස්තවාදය ඉතා ප්‍රකටව පැවති වකවානුවේදී ත්‍රස්ත ක්‍රියාවල නියැලුනු අය එවැනි ක්‍රියා සිදුකලේ බොහෝ විට අවිචාරවත් ලෙසිනි. කාර් බෝම්බ ගොඩනැගිලි තුල සවිකරණ ලද බෝම්බ මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ ප්‍රහාර ආදියෙන් බොහෝවිට හිමිවුනේ තමාව පීඩාවට පත්කරන පීඩකයන් හෝ ඔවුන්ගේ පාලනයේ සංකේත හෝ රාජ්‍ය බලවේග තුලට අයත් පුද්ගලයන්ම පමණක් නොවේ. සාමාන්‍ය ජනතාව හා අහිංසකයෝද ඒවාට බිලිවුහ. මාක්ස්වාදීහු ත්‍රස්තවාදී ක්‍රියා විවේචනය කරන්නේ එමගින් සමාජයට අහිසි ඵල විපාක අත්වන හෙයිනි.

එමගින් තමාගේ ප්‍රකාශිත අරමුන වන පංති සතුරා අවසාන වශයෙන් පරාජය කිරීමක් ඉටු නොවන හෙයිනි. ඇමරිකා එක්සත් ජනපදය උදාහරණ කර ගන්නේ නම් සතුරා වන්නේ ඇමරිකානු අධිරාජ්‍යවාදයයි එහෙත් ඇමරිකාවට එල්ල කරන ත්‍රස්ත ප්‍රහාරවලින් සිදුවන්නේ ඉඳුරාම වෙනස් දෙයකි. එමගින් ඔවුහු තම ප්‍රාග්ධනය මගින් ඉටු කරන පාලනය තව තවත් ශක්තිමත් කර ගනිමින් රාජ්‍ය ත්‍රස්තවාදය අඛණ්ඩවම ක්‍රියාත්මක කිරීමට තම රාජ්‍ය බලය වඩ වඩාත් උපයෝගී කර ගනිති. මේ සියල්ලටම වඩා සිදුවන වැඩිම අනර්ථය වන්නේ ත්‍රස්ත ක්‍රම හේතුවෙන් වැඩ කරන ජනතාව තම හාම්පුතුන්ගේ හෝ ඔවුන්ගේ නියෝජතයන්ගේ ග්‍රහනයට දේශපාලනමය වශයෙන් තල්ලුවීයාමය.

1917 - 23 දක්වා කාලය තුල ලෙනින්ගේ සමයේ රුසියාවේ පැවැති ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු රාජයය සඳහා අවශ්‍ය වන පිලිවෙත් පිළිබඳව ට්‍රොට්ස්කි විවරණයක් කලේය. ඒ සඳහා ඉඩම් අහිමිවූ ඉඩම් හිමියන්ගේ ධනවාදීන්ගේ හා ඔවුන්ට සහාය වන විදේශීය ධනවාදීන්ගේ ධවල ත්‍රස්තවාදයෙන් විප්ලවය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය ආරක්ෂක පියවර ගැන ඔහු විස්තර කලේය. අද දින මාක්ස්වාදීහු එවැනි නාමාවලියක් භාවිතා නොකරනු ඇත. කාල් මාක්ස්ගේ නිර්ධන පන්තියේ ආඥාදායකත්වය යන යෙදුමද එසේ අද නිවැරදි අයුරින් භාවිතා නොවන්නේ ස්ටැලින්වාදය මෙන්ම වැඩ කරන ජනතාවගේ සිත් තුල සමාජවාදය හා කම්කරු පංති ආඥාදායකත්වයද එසේ නිවැරදිව සම්බන්ධ නොවන හෙයිනි. මාක්ස්ගේ අදහස් වඩා හොදින් හා ජනප්‍රිය අයුරින් පහදා දිය හැකි වන්නේ සමාජවාදය හා කම්කරු පංති ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් හඬක් නැගීමෙනි. අපි ධනවාදීන්ගේ සංස්ථාපිත සංවිධිත රාජ්‍ය ත්‍රස්තවාදය හෙලා දකිමු.

## බින්ලාඩන්ගේ පසුබිම

ත්‍රස්තවාදය මතුවීමට හේතු මොනවාදැයි සොයා බැලීමේදී අපගේ අවධානය යොමුවිය යුත්තේ සමාජයීය ජාතික හා ආගමික තත්වයන් වෙතටය. අල්කයිඩා සංවිධානයේ මුලාරම්භය එහි වර්ධනයට තුඩුදුන් සමාජ පදනම ඇමරිකා එක්සත් ජනදයේදී සිදුවූ පැහැර ගැනීම් හා ඝාතන එය අනෙකුත් ත්‍රස්තවාදී සංවිධාන වෙතින් වෙනස් බවක් දක්වන බව සත්‍යයකි. බින්ලාඩන් අයත් වන්නේ ඉතා පොහොසත් සවුදි අරාබියානු පවුලකටය. ඔවුහු මුලින් පදිංචිව සිටියේ යේමනයේ දේශ සීමාවට නුදුරුව පිහිටි සවුදියේ දකුණු ප්‍රදේශයේය. සවුදි රාජ පෙලපත විසින් අවසාන වශයෙන් යටත් කරගත් ප්‍රදේශය වුයේ අසීර්ය 1930 ගනන්වල මුල් භාගය තෙක් එම ප්‍රදේශය රාජකිය පාලනයට යටත් වුයේ නැත. මෙම ප්‍රදේශය ඉහත වසර පනහ පමන තුල පාලනය කරගත නොහැකි විවිධ ක්ෂේත්‍රවලට අයත් අවිචාරවත් පිරිසකට තමාට රිසි අයුරින් හැසිමට සෙවනක් ලබා දුන්නේය. ආසීර් යනු යේමනයේ දේසීමාව අසලම උතුරින් පිහිටි ප්‍රදේශයයි. ඔසාමා බින් ලාඩන්ගේ පවුලේ මුලාරම්භය සිදුවුයේ එම ප්‍රදේශයේදීය. අල්කයිඩා ජාලයේ කොටසක් තුල ක්‍රියාකාරී වූ අනෙකුත් පිරිස විශේෂයෙන්ම පැහැර ගැනීම්වලට යොදාගත් පිරිස මධ්‍යම පාන්තික පවුල්වලට අයත් වූහ. ඉන් සමහරෙක් ඊජිප්තුවේ හා අනෙකුත් අරාබි රටවල ප්‍රභූ පෙලැන්තියට අයත්වුහ. එපමණක් නොවේ බින් ලාඩන්ට හා ඇප්ඝනිස්ථයේ තලිබාන් රෙජිමය සවුදි රජය ආධාර දුන්නේය. එය පෝෂණය කලේය.

බින්ලාඩන් හේ අල්කයිඩා සංවිධානය හෝ දරණ ආගමික බුද්ධි ප්‍රබෝධයක් ලබා ගැනීමට එරෙහි වන ආකල්ප තුල ධනවාදී විරෝධයක් හෝ විප්ලවකාරී බවක් හෝ අන්තර්ගත නොවේ. අල්කයිඩා සංවිධානයට අයත් බෝම්බ කරුවන් ප්‍රදර්ශනය කෙරෙති. මරාගෙන මැරෙන ලංකාවේ දමිල කොටි සෙබලුන් හා බෝම්බකරුවන් ප්‍රධාන වශයෙන්ම අයත් වුනේ දැඩි මර්දනයකට යටත්ව සිටි දමිල සමාජ කොටස්වලින්ය. එයට දැඩි ලෙස අවනත හෙස්බොල්ලා බෝම්බකරුවන් වුයේ වඩාත් වයසින් මුහුකුරා ගිය සිරගතව සිටිද්දී වසර ගණනාවක් දැඩි පීඩාවලට ලක්ව හොදින්ම පන්නරය ලබා සිටී පිරිස්ය.

එහෙත් වරප්‍රසාද හිමි සමාජ පන්තියකට අයත්වුවද සතුරාට ප්‍රහාරයක් එල්ල කිරීමේ අරමුනින් මරාගෙන මැරෙන බෝම්බකරුවන් සේ ක්‍රියාකර තම ජිවිත අහිමිකරගත් පුද්ගලයින් ඉතිහාසය තුල හමුවන ප්‍රතම අවස්ථාව මෙය නොවේ.

-දයානන්ද විතානගේ-

7 පිටුව බලන්න.....

# විත්‍යා ඝාතනය - ස්ත්‍රියට එරෙහි ප්‍රචන්ඩත්වයේ ප්‍රකාශයක්

-ධම්මිකා ද සිල්වා-



යාපනයේ සිදු වූ විත්‍යාගේ අමානුෂික ඝාතනය අපි නැවත වරක් අවධි කරවීමු. රටපුරා සිදුවන ස්ත්‍රී දූෂණ හා ඝාතනවල අවසානයක් යුද්ධය අවසන්වීමෙන් පසුව හෝ දක්නට නැත. මෙම සිදුවීම් දකුනෙන් වාර්තා වන විට මේවා දූෂණ හා ඝාතන ලෙස හැඳින්වේ. උතුරේ සිදුවීම් ගැන හඩ නගන විට එම දූෂණ හා ඝාතන වෙනත් අර්ථ දැක්වීම් කරමින් ඒවා සිදුවුවාට කමිනැත යන අරුතින් බැලීමට දකුණේ ජාතිවාදීන් කටයුතු කරමින් සිටී. එය කොටින් රැක ගැනීමට දරණ උත්හායක් ලෙස ජාතිවාදීන් හුවා දැක්වීමට උත්සාහ දරණ බව පෙනේ. උතුරේ හඳවත් කම්පාකළ උතුරේ ස්ත්‍රී දූෂණයන් හා ඝාතනයන් වාර්තා වන්නේ 1996 අගෝස්තු 7 වන දින ක්‍රිෂාන්ති කුමාරස්වාමි හමුදා සෙබලුන් විසින් ඝාතනය කර මරා දැමීමෙන්ය. එපමණක් නොව ඇයගේ මවද ඝාතනයට ලක්විය. ඊට පසුව 2006 ජුනි 30 වන දින ප්‍රේමනි දනුෂ්කොඩි නැමැත්තිය දූෂණය කොට මරා දමන ලදී. මෙම සිද්ධිය එදා දකුණේ ජනතාව සාධාරණීකරණය කලේ ඇය කොටි සාමාජිකාවක් ලෙස හඳුන්වමිනි.

ස්ත්‍රී දූෂණ හා ඝාතන රාජපක්‍ෂ පාලන කාලයේ සීඝ්‍රයෙන් වර්ධනයවී ඇති බව සංඛ්‍යා ලේඛන දෙස බැලීමේදී පෙනී යයි.

**"2009 වසරේදී ස්ත්‍රී දූෂණ 1624ක් වාර්තා වී ඇත. 2010 වසරේදි 1854ක් වේ. 2010 සිට 2012 දක්වා ස්ත්‍රී මරණ 17ක් සිදුව ඇත. 2010දි නව හැවිරිදි දැරියක් සමූහ දූෂණය කිරීමේ සිද්ධියක්ද මඩකලපුවෙන් වාර්තා විය. එහි සැකකරුවන් වුයේ හමුදා සෙබලුන් 6 දෙනෙකි. 2012 දෙසැම්බරයේදී යාපනයේ මණ්ඩතිව්හිදී සිව් හැවිරිදි දැරියක් දූෂණය කොට මරාදමා තිබුනි. 2014දී 11 හැවිරිදි තවත් දැරියක් සමූහ දූෂණය කිරීම සම්බන්ධයෙන් හමුදා භටයන් 7දෙනෙකුට චෝදනා එල්ල විය."**

මේ දැනට උතුරු නැගෙනහිර ඇතුලු ප්‍රදේශවලින් වාර්තාවී ඇති සංඛ්‍යා ලේඛණවේ. මීට අමතරව උතුරේ ස්ත්‍රීන්ට එරෙහිව බොහෝ අපරාධ සිදුවී ඇති බව පෙන්වා දී ඇත. යුද්ධයෙන් පසු උතුරේ වසරකට ළමා දූෂණ හා අපචාර සිද්ධීන් 600ක් පමණ වාර්තා වන බව යාපනය දිසාපතිවරයා 2012 මාර්තු මාසයේ මාධ්‍යයට වාර්තා කර ඇත. උතුරේ සිදුවන දූෂණ වල සැබෑ ස්වභාවය වාර්තා කිරීමට ඔවුන් දක්වන බිය නිසා දෙමළ සමාජයට මේවා හදවතින් දරාගැනීමට සිදුවී ඇත. ඉහත දැක්වුයේ උතුරේ ස්ත්‍රී දූෂණ හා ඝාතන වල ඉතිහාසයෙන් බිඳකි.

පසුගියදා යාපනයෙන් වාර්තා වු විත්‍යා ශිෂ්‍යාවගේ ඝාතනය මහත් ආන්දෝලනයකට බඳුන් විය. මෙම සිදුවීමේදී පොලිසිය ක්‍රියාකාර ඇති ආකාරය පිළිබඳව ප්‍රශ්න මතුවී ඇත. ඒ තුලින් කෝපයට පත් ජනතාව පාරට බැසීම අරුමයක් නොවේ. ස්ත්‍රී දූෂණ සිදුවන්නේ කහවත්තේද දකුණේ වෙනත් ප්‍රදේශයකද උතුරේ යාපනයේද යන්න පිළිබඳව බලා නිර්වචනය කල නොහැක. එය සමස්ථ රටේ ස්ත්‍රීන්ට හා දරුවන්ට සිදුවන අපරාධ ලෙස සැලකිය යුතුය. ජාතිවාදීන් සිතා සිටින්නේ දෙමල ජනතාවට සිදුවන අපරාධ කමිනැත යන අරුතිනි. ඒ නමුත් හිටපු ජානධිපති මහින්ද රාජපක්‍ෂ යාපනයේ සිද්ධිය සුළු දෙයක් ලෙස පෙන්වාදීමට උත්සාහ කිරීම පුදුමයක් නොවේ. මන්ද ඔහුගේ ආණ්ඩු කාලයේ ස්ත්‍රී දූෂණ හා මරණ විශාල වශයෙන් වර්ධනය වී ඇති බැවිනි. තංගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් සිටියදී ඔහුගේ පාලන සමයේ රුසියානු ජාතික තරුණියකවූ 23 හැවිරිදි වික්ටෝරියා ඇලෙක්සැන්ඩ්‍රා දූෂණය කොට ඇයගේ පෙම්වතා ඝාතනය කරන ලදි. එය සිදු කරන ලද්දේ හිටපු ජනාධිපතිවරයාගේ සමීපතමයකු විසින් ජනාධිපතිවරයාගේ ගම් ප්‍රදේශයේදීය. බොහෝ ප්‍රමාදවී හෝ ඔහුට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට පෙළඹුනේ රුසියානු රජයේ මැදිහත්වීම නිසාය. නැතිනම් තවත් එක් සිද්ධියක් ලෙස පරීක්ෂණ නැති ස්ත්‍රී දූෂණ ලැයිස්තුවට එයද ඇතුලත්වීමට ඉඩ තිබුනි.

මීට අමතරව පසුගිය කාලය තුල සෑම දිනකම වාගේ ස්ත්‍රී දූෂණ හා ළමා අපචාර සිද්ධීන් බොහෝමයක් වාර්තා විය. කුඩා ළමුන් පැහැර ගැනීම් විශාල වශයෙන් පසුගිය සමයේ සිදුවිය. මෙම තත්වයන් පාලනය කර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට ධනපති ආණ්ඩු කටයුතු කලේ නැත. මෙවැනි තත්වයක් තුල මේවා වර්ධනයවීමට එක් හේතුවක් වී ඇත්තේ රටතුල පැතිරෙමින් තිබෙන මත්ද්‍රව්‍ය නිසා බව සමහර නිරීක්ෂණ වලින් පෙන්වා දී ඇත. පසුගිය මාසය දෙක තුල අසන්නට ලැබුනු ළමා දූෂණ හා අපචාර සිද්ධීන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවු පුද්ගලයන් විසින් සිදුකල බව වාර්තාවේ.

සමස්ථයක් ලෙස ගත්විට ගෝලීය ධනවාදී විවෘත ආර්ථික ක්‍රියාවලිය තුළ සියලු මනුෂ්‍ය සාරධර්ම පිරිහිගොස් මිනිසුන් තිරිසනුන්ගේ තත්වයට ඇදදමා ඇත. රටේ නීතිය හරිහැටි ක්‍රියාත්මක නොවීමත් පවතින නීතිරීති ප්‍රමානවත් නොවන නිසාත් සමාජ පිළිලයක් ලෙස මේවා වර්ධනයවී ඇත. අපේ රටේ ජනමාධ්‍ය මේවා වාර්තා කරන්නේ තමන්ගේ පුවත්පත අලෙවි කර ගැනිමේ උවමනාවෙන් මිස සමාජ ප්‍රශ්නයක් ලෙස ගෙන මේවා පිටුපස තිබෙන සමාජ ආර්ථික හා දේශපාලන ප්‍රශ්න ගැඹුරින් වාර්තා නොකිරීමට වගබලාගෙන ඇත.

මාධ්‍ය විසින් සිදුකල යුතු කාර්ය හරිහැටි ඉටුවන්නේ නැත. ජනතාව සත්‍ය තොරතුරු වලින් දැනුවත් කිරීමේ දී මාධ්‍ය ඉතාම දුර්වල තත්වයක පවති. මළගමට දේශපාලඥයන් සහභාගිවු පමනින් ඔවුන්ගේ ප්‍රශ්න වලට විසඳුම් ලැබෙන්නේ නැත. තවමත් මෙම සිද්ධිය පිළිබඳව පැහැදිලි පියවරක් ගැනීමට මෛත්‍රී රනිල්ගේ යහපාලන ආණ්ඩුව අසමත්ව ඇත. මෙවැනි දූෂණ හා ඝාතන මැඩලීමට රජය ගන්නාවූ පියවර කුමක්ද යන්න රටම බලාසිටී. පසුගිය රජයට චෝදනා එල්ලවුයේ ඔවුන් ඒවා මැඩලීමට පියවර නොගත් නිසාය. ජනවාරි 8 වනදා රටේ බහුතර ජනතාව ඒකාධිපති රාජපක්‍ෂ පවුල් පාලනය පරාජය කර ජනතාව යහපාලන ආණ්ඩුව බලයට පත්කලේ අඩුම තරමින් බියසැක නැතිව තම දරුවන් සමඟ තනිව නිවසේ ජිවත්විය හැකි වාතාවරණයක් උදාවනු ඇතැයි බලාපොරොත්තුවෙනි.

උතුරේ සිද්ධිය දෙස බැලීමේදි පෙනී යන්නේ එම ජනතාවගේ ජීවිතවල පවතින අවිනිශ්චිත භාවයයි. යුද්ධය නිමවී වසර 6ක් ගතවන මොහොතේ නිදහසේ තනිවම පාරේ ගමන් කිරීමට පාසැල් ශිෂ්‍යාවකට නොහැකිවී ඇත. මෙම සිදුවීම වලින් දහස් ගනනින් වැන්දඹුවන් සිටින උතුරු කරයේ කාන්තාවන්ගේ ඉරණම කෙබදුදැයි සිතා ගැනීම අපහසු නොවේ. පසුගියදා වාර්තාවී තිබුනේ උතුරේ පුරවැසියන් 6 දෙනෙකුට 1ක් බැගින් හමුදා සෙබලුන් සිටින බවයි. මෙවන් තත්වයක් තුල වැන්දඹු කාන්තාවන්ගේ හා ළමා හා තරුණියන්ගේ ආරක්ෂාව සැපයීම සම්බන්දයෙන් සෘජු ලෙසම වගකීම පැවරෙන්නේ ආණ්ඩුවටය. විත්‍යාගේ මව ප්‍රකාශ කර තිබුනේ තම දියණියගේ ඝාතනයෙන් පසුව එම ප්‍රදේශය අතහැර යාමට සිදුවී ඇති බවයි.

ඒ ඔවුන්ට ජීවත්වීමට සුදුසු ආරක්ෂිත පසුබිමක් තමන් හැදීවැඩුනු එම ප්‍රදේශයේ නොමැතිවීමයි. උතුරේ ජනතාව අද කියන්න පටන් අරන් තියෙන්නේ එල්ටිටිඊ එක තිබුන නම් මීට වඩා හොඳයි කියලයි. ඒ එම ප්‍රදේශවල ජනතාව කොටි සංවිධානයට තිබූ භය නිසා හෝ මිනිසුන් සීලාචාර ලෙස ජීවත්වු නිසාය. මෙයින් පෙනන්නේ මේ දකුණේ සිංහල ධනපති පාලන ක්‍රමය ගැන උතුරේ ජනතාවට තියෙන බිය හා සැකයයි. සමස්ථයක් ලෙස රටේ කාන්තාවන්ට හා ළමුන් ආරක්ෂාවක් දිය නොහැකි ධනපති පාලකයන්ට උතුර ගැන විශේෂ ආරක්ෂාක වැඩ පිළිවෙලක් සැපයිමට ඔවුන් කටයුතු නොකරන බව එම ජනතාව හොදාකාරවම දනී.

අද රටේම ස්ත්‍රීන්ගේ හා දරුවන්ගේ ජිවිත අනතුරුදායක තත්වයට පත්ව ඇත. රජය මේ ගැන අවධානය යොමු නොකරන්නේ නම් විත්‍යාලාගේ ඛේදවාචකය උතුරේ පමනක් නොව දකුණේද ඇතිවීම වැලැක්විය නොහැකියි. නීතිය හරිහැටි ක්‍රියාත්මක කලයුතු වනවා පමණක් නොව පාලකයින් ආදර්ශමත්ව කටයුතු කිරීම අවශ්‍යවේ.

රටපුරා සිදුවන මහා පරිමාන අපරාධ හා මත්ද්‍රව්‍ය අලෙවිය ස්ත්‍රී දූෂණ හා ළමා අපචාර වැනි බොහෝ සිද්ධීන් වලට දේශපාලකයන්ගේ සෘජු සම්බන්ධයක් ඇති බව පෙනී යයි.

**7 පිටුව බලන්න....**



# අපි සටන් වදින්නෙමු

**එක්සත් සමාජවාදී පක්ෂය උතුරේ හා දකුණේ කම්කරු පංතියේ ඒකාබද්ධ ජන අරගලයක් තුලින් කුරිරු ධනපති ක්‍රමය පෙරලා දමා සැලසුම් සහගත ආර්ථික වැඩ පිළිවෙලක් තහවුරු කර ප්‍රජාතන්ත්‍රිය සමාජවාදී පාලනයක් ගොඩනැගීමට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් කටයුතු කරයි. එම ඉලක්ක ජය ගැනීම සඳහා පහත සඳහන් මූලික කරුණු වෙනුවෙන් අප පක්ෂය පෙනී සිටී.**

- ඒකාධිපති පාලනයක් තහවුරු කෙරෙන විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කිරීමණී වෙනුවෙන් සටන් වැදීම.
- මුළුරටම මිලිටෙරිකරණයට යටත්කර ප්‍රජාතන්ත්‍රිය පැවැත්ම අහෝසි කිරීමට ගෙන ඇති පියවරයන්ට එරෙහිව සටන් වදින අතර උතුරේ හමුදා පාලනය ඉවත්කර සිවිල් පාලනය තහවුරු කිරීමට බල කිරීම.
- ඊනියා පුනරුත්තාපන සහ රඳවා ගැනීමේ කඳවුරු අහෝසිකර සියලු දේශපාලන සිරකරුවන් නිදහස් කිරීමට බල කිරීම.
- උතුරේ, නැගෙනහිර හා කඳුකරයේ සුළුජාතික ජනකොටස්වල ජාතික අභිලාෂයන් ආරක්ෂාකරමින් උතුරේ දෙමළ ජනතාවගේ ස්වයංනිර්ණය අයිතිය පදනම් කරගෙන ලංකාවේ ජාතික ප්‍රශ්නය විසඳීම වෙනුවෙන් කටයුතු කිරීම.
- ලිවිමේ කියවීමේ හා කථා කිරීමේ නිදහස හා රැස්වීම් සංවිධානය වීමේ හා විරෝධතා උද්ඝෝෂණ පැවැත්වීමට ජනතාවට තිබෙන අයිතිය වෙනුවෙන් පෙනී සිටීම. කලාකරුවා හා කලාමාධ්‍ය රාජ්‍යග්‍රහණයට යටත්කිරීමට එරෙහිවීම.
- වැඩකරණ ජනතාවට වෘත්තිය සමිති පිහිටුවීමට හා වැඩ වර්ජන ඇතුලු වෘත්තිය සමිති කටයුතු වල යෙදීමට තිබෙන මූලික අයිතිය වෙනුවෙන් සටන් කිරීම.
- නිදහස් අධ්‍යාපනය විනාශකිරීමට දරණ ප්‍රයත්නයන්ට එරෙහිව සටන් වදින අතර අධ්‍යාපනය සඳහා දළ දේශිය නිෂ්පාදනයෙන් 6%ක් වෙන් කිරීමට බලකිරීම.
- පුද්ගලික විශ්වවිද්‍යාල ඇතුලු අධ්‍යාපන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරමින් පවතින පුද්ගලීකරණය නවතා දැමීම.
- නිදහස් සෞඛ්‍ය සේවය රැකගැනීම හා ඖෂධ සමාගම් වල ග්‍රහණයට නතුනොවු ඖෂධ ප්‍රතිපත්තියක් ගොඩනැගීම.
- කාන්තාවන්ට එරෙහි හිංසනය සහ ප්‍රචන්ඩත්වය යෙදවීමට එරෙහිවන අතර කාන්තාවන්ගේ සමාන නියෝජනය හා සම වැටුප් අයිතිය තහවුරු කිරීම.
- උතුරේ ජනතාවගේ ඉඩම් උදුරාගැනීම වහා නතර කරන ලෙස බලකරන අතර දකුණේ පීඩිත ගොවි ජනතාවගේ ගොවිබිම් වල අයිතිය තහවුරු කිරීම.
- රාජ්‍ය අංශය, පුද්ගලික අංශය හා වතු කම්කරු ක්ෂේත්‍රවල කම්කරු ජනතාවට ජීවත්වීමට සරිලන වැටුප් වැඩිවීමක් ලබා ගැනීම ඇතුලුව සියලු අංශ වලට අදාලවන පරිදි ජීවන අංක ඒකකය රු.280/-ක් ලෙස වහා ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ගැනීම.
- විදුලිය, ජලය, තෙල් ඇතුලු මහජන උපයෝගිතා සේවාවන් වල මිල ඉහල දැමීම වහා නවතා දමන ලෙසත් එකී සේවාවන් කොටස් වශයෙන් පුද්ගලිකරණය කිරීම ගෙන තිබෙන පියවරයන් වහාම නවතන ලෙසත් බලකිරීම.
- ජාතිවාදී බලවේග විසින් ජාතිවාදය ඇවිස්සීම හා ආගම් අතර ගැටුම් ඇති කිරීමට දරණ නින්දිත ප්‍රයත්නයට එරෙහිවීම හා මුස්ලිම් ජාතිකයින් ඇතුලු අන්‍ය ආගම්වලට සිය ආගමික කටයුතු කිරීමට තිබෙන අයිතිය ආරක්ෂා කිරීම. හා කිසිම ආගමක් නොඅදහා සිටීමට ජනතාවට තිබෙන අයිතිය තහවුරු කිරීම.

**එක්සත් සමාජවාදී පක්ෂය කම්කරුවන් දුප්පත්ගොවීන් හා තරුණයින්ගේ නිර්ධන පංතික පක්ෂය ලෙස ඉහත අයිතීන් දිනා ගැනීම වෙනුවෙන් අභිතව සටන් වදිනු ඇත.**

# මාක්ස් එදා මෙන්ම අදද නිවැරදිය



ආර්ථිකය පිළිබඳව පැහැදිලිකර ගැනීමටත් ලෝකයේ වර්ධනය වෙමින් පවත්නා ධනේෂ්වර අර්බුදය නැතිනම් ගැටුම් නොසන්සුන් බව කුමන හේතු මත ඇති වන්නක්ද යන්න පහදා ගැනීමටත් ලෝකයපුරා බොහෝ විචාරකයෝ මාක්ස්ගේ සංකල්ප වෙත නැවත නැඹුරුවීමේ ප්‍රවනතාවයක් දකින්නට තිබේ.

නව ලිබරල් ධනවාදයේ අර්බුදය සමග සමහර විචාරකයන්ගේ දෑස් අතරට යථාර්ථය පිවිසෙන්නට පටන්ගෙන ඇත. මේ හේතුවෙන් ධනවාදයේ අර්බුදයේ ස්වභාවය පිළිබඳ මාක්ස්ගේ විශ්ලේෂණයන් අර්ධ වශයෙන් හෝ හඳුනා ගැනීමට මෙම විචාරකයන්ට සිදුවී තිබේ. මාක්ස් පැහැදිලිකර දුන් පරිදි මෙම අර්බුද එම ධනේෂ්වර පද්ධතියට නිසර්ගයෙන්ම අන්තර්ගත වෙයි.

ධනවාදය යනු චක්‍රිය පද්ධතියකි. විවධාකාර හේතු නිසා හදිසියේම හෝ ක්ෂණිකව ධනේෂ්වර ක්‍රමයේ අර්බුද ඇතිවිය හැක. එය මුල්‍යමය කඩා වැටීමක් හෝ දේශපාලනික අස්ථාවරත්වයක් මත වුව සිදුවිය හැකිය. කෙසේ වුවද මාක්ස් විසින් මුලදීම විස්තර කරන ලද අයුරින් අර්බුදයක් ඇතිවීමට යටි තලයේ ගැබ්වූ හේතුන් වන්නේ ධනවාදය තුලම ඇති මුලික ප්‍රතිවිරෝධතාවයන්ය නැතිනම් පරස්පර විරෝධයයි.

එක් අතකින් නිෂ්පාදනයේ සමාජමය සමුහමය ස්වභාවයත් අනෙක් අතින් නිෂ්පාදන මාර්ගවල පෞද්ගලික අයිතියත් අතර එලිපිට පවත්නා ගැටුමකි. ඊට අමතරව ලෝක වෙළඳපොල හා ජාතික රාජ්‍ය මගින් නිර්ණය කර ඇති සීමාවන් අතර එලිපිට පවත්නා ගැටුමකි. ධනවාදය පදනම් වන්නේ සමාජමය අවශ්‍යතා මත නොව ලාභය සඳහා නිෂ්පාදනය කිරීමයි. නව අගයන් නිර්මාණය කරන්නේ කම්කරු පන්තියයි. එසේ වී නමුත් ඔවුනට වේතනය වශයෙන් ලැබෙන්නේ එම නව අගයෙන් ඉතා සුලු කොටසක් පමනකි.

ඉතිරිය එනම් අතිරික්ත වටිනාකම ධනපති පංතිය අත්පත්කර ගනිති. එහි ප්‍රතිපලයක් ලෙස තමා විසින්ම නිෂ්පාදනය කරන භාණ්ඩ ආපසු වෙළඳ පොළ තුලදී මිලදී ගැනීමට සාමුහික ලෙස කම්කරු පන්තියට ආර්ථික වශයෙන් හැකියාවක් නැත. ධනපතින් අර්ධ වශයෙන් මෙය විසඳන්නේ අතිරික්තයේ එක්තරා අනුපාතයක් කර්මාන්තවල වර්ධනය සඳහා යොදවමිනි. එහෙත් එයින් සිදු වන්නේ තව තවත් භාණ්ඩ නිෂ්පාදනය වැඩිවීමයි. එමගින් සිදු වන්නේ එක්තරා අවස්ථාවකදීද ගැටළුව මහත් සේ උග්‍රවීමයි. වලක්වාලිය නොහැකි ප්‍රතිපලය වන්නේ අධිනිෂ්පාදනය හා අධිධාරිතාවය දිර්ඝකාලින වශයෙන් ධනවාදීන්ට පාලනය කල නොහැකි ලෙස මෙම ගැටළුව වර්ධනය වීමය. එහි ප්‍රතිපලයක් වන්නේ අර්බුදය නිසා ඉරිතලා පුපුරා ගිය පද්ධතියක් බවට ධනවාදය පත්වීමයි.

නුතන ආර්ථිකයේ මුලික ලක්ෂණ කුමක් වනු ඇද්දැයි යනුවෙන් ඉතා හොදින් මාක්ස් විසින් අනාවැකි පලකර ඇති බව සමහර මධ්‍යස්ථ විචාරකයන් පිලිගන්නී. නමුත් පොදුවේ ගත්කල මාක්ස්ගේ නිගමනයන්ගෙන් ඈත් වීමට ඔවුහු යත්න දරති. මාක්ස් ඉතා ප්‍රසිද්ධ ලෙසම මෙසේ ප්‍රකාශ කළේය. "දාර්ශනිකයන් මෙම ලෝකය පිළිබඳව අර්ථ නිරූපණයක් පමණක් කර ඇත. එසේ වුවද වැදගත්ම කරුණ වන්නේ ලෝකය වෙනස් කිරීමයි."

මෙයින් ගම්‍ය වන්නේ ධනවාදය ඓතිහාසිකව සිදුකළ කාර්යභාරය පිළිබඳව කිසිදු ධනාත්මක දෙයක් මාක්ස් නුදුටු බවක් නොවේ. ධනවාදයට ආවේනික සියළු කෲරත්වය තිබියදී වුවද නිෂ්පාදන බලවේගයන් හා වෙළඳ පොල වර්ධනය කිරීමේ ලා අවශ්‍ය ඓතිහාසික කාර්යභාරය ධනවාදය විසින් ඉටුකරන ලද බවද ඔහු හඳුනා ගත්තේය. එහෙයින් එය පෙර පැවති වැඩ වසම් යුගයට අයත් සමාජයන් පසුකර ඉදිරියට යාමකි. අද වන විට ධනපති විරෝධී ව්‍යාපාරයේ නිරතවන බොහෝ දෙනෙකුට ධනවාදය යන සංකල්පය ප්‍රගතිශිලි බලවේගයක් ලෙස සිතීමට දෙයක්වත් ඉතුරුවී නොමැත. එසේ වුවද එමෙන්ම මහා ධනස්කන්ධය විසින් විද්‍යාව හා තාක්ෂණික ක්‍රමවේද වැඩි දියුණුවීම හරහා සමාජවාදී සමාජයක් බිහි කිරීම සඳහා අත්තිවාරම දමා ඇති බවද තේරුම් ගත යුතුය. ධනේෂ්වර ක්‍රමය විසින් කම්කරු පංතියක් බිහිකර ඇතිවා පමණක් නොව ධනේෂ්වර පංතියේ මිනීවල හෑරීමද එම කම්කරු පංතිය විසින් සිදු කරන බව මාක්ස් ප්‍රකාශ කළේ එබැවිනි.

එසේ නමුත් ධනවාදය යටතේ වස්තුව හා බලය සුලු පිරිසගේ එනම් ධනපතීන් අතලොස්සකගේ හස්තයන් තුල සැමවිටම ඒකරාශවී සාන්ද්‍රණය වී ඇත. එමෙන්ම තාක්ෂණය හා විද්‍යාවේ ප්‍රගතියට මුලික වි තිබෙන්නේ තර්කානුකුල හේතුන් නොව පුද්ගලික ලාභ ලබා ගැනීමේ අවශ්‍යතාවයයි. ඔවුන් විසින්ම පණ පෙවූ නිෂ්පාදන බලවේග පූර්ණ වශයෙන් උපයෝගී කර ගැනීමට ධනවාදයට කොහෙත්ම හැකියාවක් නැත. ධනවාදී ක්‍රමය මුහුණදෙන එක් ප්‍රධාන ගැටලුවක් වන්නේ එයයි.

ධනේෂ්වර ක්‍රමය විද්‍යාව හා තාක්ෂණය අර්ධ වශයෙන් හා අප්‍රමානවත් අයුරින් භාවිතා වන පද්ධතියකි. එමෙන්ම ධනවාදී වෙළඳ පොළේ සමාජමය හා දේශපාලන ව්‍යාකුලත්වය විසින් දරිද්‍රතාවයෙන් පිරුණු පීඩිතයින් බොහෝ දෙනා විස්තාපනය කර සම්පත් හා බලය වැඩිකරගත් ධනවතුන් කිහිප දෙනෙකු බිහිකිරීමට සමත් වනු ඇත.
මාක්ස් හා එංගල්ස් 19 වන සියවසේදී ලියන ලද සියල්ලම දැන් සිදුවන දේ නිසා එලෙසින්ම තහවුරුව ඇතැයි මෙයින් අදහස් කරන්නේ නැත. සමාජවාදී විප්ලවයේ ආසන්නතාවය හා කාලසීමාව පිළිබඳව සහ එවැනි තවත් සමහර අනාවැකි පළකිරීම වැනි කරුණුවලදී ඔහු සම්පූර්ණයෙන් නිවැරදි වූයේ නැත.

1848දී සකස් කරන ලද ඉල්ලීම් මේ වන විට ඒ අයුරින්ම ක්‍රියාවට නැගිය නොහැකිය. එමෙන්ම ඒ දවස පැවති සමාජයට වඩා අද සමාජය බොහෝ අයුරින් සංකීර්ණය. ඒ කෙසේ වුවද සමාජය ගැන විධිමත් ලෙස ඔවුන් පලකල පුදුම විය හැකි තරම් වන අදහස් රාශියක් එදා ඒවා ලේඛණගත කළ දිනයේදී මෙන්ම අදටත් වලංගුවේ. අතිරික්ත වටිනාකම පිළිබඳ න්‍යාය ධනේෂ්වර ක්‍රමය පවතින තාක් තිබෙන නිරපේක්ෂ සත්‍යයකි.

දාර්ශනිකයන් මෙම ලෝකය පිළිබදව අර්ථ නිරූපණයක් පමණක් කර ඇත. එසේ වුවද වැදගත්ම කරුණ වන්නේ එය වෙනස් කිරීමයි. යනුවෙන් මාක්ස් විසින් පලකල අනාවැකිය එදාටත් වඩා වර්තමාන ලෝකයට වඩා උචිත වන බව නොකිවමනාය.

- ටානියා සමාධිනී -

---

4 පිටුවෙන්.....

## වමේ පාවාදීම්

නිවැරදි විප්ලවවාදී සංවිධානයක් ලෙස පදනම් දමාගත් නසසපයේ බිඳවැටම හා ඊට සමගාමීව ඇරඹුන දේශපාලන පිරිහිම 1980 වැඩ වර්ජනය හා ඉතා සමීපව බැඳ ඇත. 1980 -89 කාළය තුල නසසප සුළුතර කණ්ඩායම ලෙසින් මහජන පක්ෂයේ පංති ස්වභාවය (වික්‍රමබාහු විජය කුමාරතුංග හැදින්වුයේ කම්කරු නායකයෙකු ලෙසිනි) ඉන්දු - ලංකා ගිවිසුම හා නූතන අධිරාජ්‍යවාදයේ ස්වභාවය ගැන දීර්ඝ න්‍යායික සාකච්ජාවක අපි නියැලුනි. මේ වන විට නව සමසමාජ නායකත්වය සමාජවාදී ව්‍යාපාරය ගොඩනැගීමේ ඉතිහාසයට පයින් ගසා ධනපති පංතියේ වලිගයක් බවට පත්ව ඇත. 1994 දී පමණ වමේ ව්‍යාපාරයෙන් පලාගිය වාසුදේව ධනපති අණ්ඩුවල කිහිලි කරුවෙකු ලෙස කරක් ගැසූ අතර මේ වන විට අන්ත ජාතිවාදී මඩ ගොහුරේ ගිලී ගමනක අවසානය සනිටුහන් කරමින් සිටී.

මෙම පසුබිම තුළ නූතන වමේ ව්‍යාපාරය ඉදිරියේ පවතින්නේ දැවැන්ත අභියෝගයකි. පැරණි වමේ නායකයින්ගේ පාවාදීම් වලින් අනතුරුව ගොඩනගන ලද අලුත් වම ලෙස කටයුතු කළ ජවිපෙය හා නසසපය නව ලිබරල් ධනේෂ්වර දේශපාලනයට දණ්ඩ නමස්කාර කර යටත්වී හමාරය. වම කෙරෙහි අවධානයෙන් සිටින තරුණයින්ට මේ ගැන ඇත්තේ බරපතල කළ කිරීමක් හා ප්‍රශ්නාර්තයකි. මෙම සන්දර්භය තුල නවක කම්කරුවන් හා තරුණයින් වම ගොඩනගා ගැනීම සඳහා අලුත් සාකච්ජාවකට ඇතුලත් විය යුතුය. ඒ සඳහා පැරණි වමේ ඉතිහාසයේ පාවාදීම්වල සිට අද සිදු කෙරෙමින් පවතින පාවාදීම් දක්වා ගැඹුරු හැදෑරීමක් කළ යුතුව ඇත. මේ සියලු පාවාදීම්වලට එරෙහිව සමාජවාදී ව්‍යාපාරයේ ධජය බිම නොදමා ජාතිවාදයට නව ලිබරල් ධනවාදයට හා හවුල් දේශපාලනයට එරෙහිව අභිතව සටන් කරනුයේ එක්සත් සමාජවාදී පක්ෂය පමණී. ධනවාදය පිළිකුල් කරන සමාජවාදය කෙරෙහි විශ්වාසය තබා ඇති කම්කරුවන් හා තරුණයින් සමාජවාදී ව්‍යාපාරය ගොඩනගා ගැනීම සඳහා අප ගෙනයන අරගලය හා බද්ධ වන ලෙස අවධාරණය කරමු.

---

5 පිටුවෙන් .....

## ත්‍රස්තවාදී විධික්‍රමය හා ....

19 වන සියවසේදී ජාතික පීඩනයට එරෙහිව අරගල කිරීමේදී චඩාත්ම කැමැත්තක් දැක්වුයේ මෙම ක්‍රමයටය. ජපානයේ කමිකාසේ මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ උදාහරණයද මෙහිදී සැලකිල්ලට ගත යුතුවේ. ත්‍රස්තවාදය ඇතිවීමට හේතු මොනවාදැයි තේරුම් ගැනීම ඉතා අවශ්‍යය.

එහෙත් එහි අදහස වන්නේ වෙනත් අයෙකු උපයෝගී කර ගන්නා ක්‍රම පිළිබද වගකීමෙන් අංශුමාත්‍රයක් පමණක් වත් සමාජවාදීන් හා මාක්ස්වාදීන් විසින් බාරගත යුතු බවක් නොවේග බොහෝ දෙනෙක් ලේ පිපාසිත යුදකාමීන් නොවේ. එහෙත් යම් විකල්ප විසදුමක් ඉදිරිපත් නොවන්නේ නම් ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක් වෙනුවෙන් නැගෙන තර්ක සමග ඔවුන් ඉදිරියට යනු ඇත්තේය.

එක්සත් සමාජවාදී පක්ෂය හා එහි ආධාරකරුවන් හුදෙක් හැම කරුණක්ම සාමයෙන්ම විසඳිය යුතුයයි සිතන ඊනියා සමාජවාදීහු නොවෙති. කොයි අතකින් ප්‍රහාර එල්ල වුවත් අප හමුවේ ඇති සියළුම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවේදයන් මගින් අපි වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් (වැඩ වර්ජන කිරීමේ අයිතිය එක්රැස්වීමේ අයිතිය නිදහස් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය) ආරක්ෂා කිරීමට කැපවෙමු.

අධිරාජ්‍යවාදීන් විසින් ලොවපුරා දියත් කරනු ලැබූ ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය මගින් ධනවාදයට විරුද්ධ වන කම්කරුවන් තරුණයින් එනම් ගෝලීයකරණයට එරෙහි වන පිරිස් ත්‍රස්තවාදීන් ලෙස ලොවට පෙන්වා දීමට සැරසෙනු ඇත. දක්ෂිණාංශිකයින් විසින් එල්ල කරන ප්‍රහාර හා ධනවාදීන්ගේ ප්‍රහාර වලින් ආරක්ෂා වීම සඳහා සටන් වැදීමට වැඩ කරන ජනතාවගේ කම්කරු සංවිධානවලට ඇති අයිතිය ධනවාදින් විසින් ත්‍රස්තවාදී ක්‍රම හා සමාන කිරීමට යත්න දරනු ඇත. තම අධ්‍යාංශය කොතෙක් දුරට නිවැරදි වුවත් ත්‍රස්තවාදී ක්‍රම හෙලා නොදැක වක්‍රෝන්තියෙන් සත්‍ය සඟවා කටයුතු කලහොත් එය ධනවාදීන්ට මහත් රුකුලක් වනු ඇත.

අසාර්ථක පුද්ගල ත්‍රස්තවාදී විධික්‍රමය එරෙහිවම මතවාදීමය වශයෙන් සටන් කරන එක්සත් සමාජවාදී පක්ෂය රතුතරුව පුවත්පත හා අපගේ ආධාරකරුවන් ලෝකයේ නවලිබරල් ධනවාදය තුරන් කිරීමට හා සමාජවාදය ස්ථාපිත කිරීමට අවශ්‍ය අධ්‍යාපනය ලබා දෙමින් සංවිධානගත කරමින් උද්ඝෝෂණ කරමින් මහා ජනතා අරගලයක් ඉලක්ක කර ගනිමින් පංති අරගලයේ නිරත වනු ඇත.

---

6 පිටුවෙන් ....

## විත්‍යා ඝාතනය - ස්ත්‍රියට එරෙහි ....

එබැවින් මෙවැනි ක්‍රියාවලට අනියමින් හෝ සහයෝගය දක්වන දේශපාලකයන්ටද දැඩි දඩුවම් පැමිනවිය යුතු අතර ඔවුන් දේශපාලන භූමියෙන් පලවාහැරිය යුතුය. මෙතෙක් වාර්තාවී ඇති රටපුරා ව්‍යාප්තව සිදුවන කිසිදු අපරාධයකට ආදර්ශමත්ව නිසි දඩුවම් ලබාදීමට ධනපති ආණ්ඩු අසමත්ව ඇත.

ඉන් පෙනී යන්නේ සිදුවීමක් ආසන්නයේ මාධ්‍ය සංදර්ශණ පැවැත්වීම හැර සැබෑ ලෙස ඒවා මැඩ පැවැත්වමට ඔවුන්ට උවමනාවක්ද නැති බවය. නීතිය වල්වැදී ඇති රටක ජනතාව ඉදිරියේ ඉහල පන්තියේ අයට අවශ්‍ය ලෙසට නිතිය අවනීතිය බවට පත්වන බව ඇස්පනාපිට පෙනෙද්දී ජනතාව පාරට බැසීමද වරදක් ලෙස පෙන්වාදීමට දරන නීච උත්සාහය උතුරේ සිද්ධියෙන් පෙන්වාදී ඇත.

ජනතාව සදාකල් බියවද්දා තබා ගැනිම තුලින් ඔවුන්ට ජයගත හැකියයි පාලකයින් සිතන්නේ නම් මහා මුලාවකි. අවනිතිය රජකරවන තත්වයට එරෙහිව නැගී සිටීමට කටයුතු කිරීම සමඟ නිමක් නොදුටු ජරාජීර්න මෙම සමාජ ක්‍රමය වෙනස් කර සාධාරණ සමාජයක් ගොඩනැගිම සඳහා අද දිනයේදී කටයුතු කිරීම සියලු දෙනාගේ වගකීමවේ.

මේවාට එරෙහිව හඬනැගිම සඳහා පුලල් ජනතා බලවේගයක් ගොඩනැගී මට අවධිවෙන ලෙස ධනපති සමාජයෙන් පීඩා විඳින කාන්තාවන්ට අපේ ඇරයුම්.

# රු 2500 /= වහා දියව් !

**පෞද්ගලික අංශයේ සේවයේ නියුතු 70 ලක්ෂයක් පමණ වන සේවකයින්හට රුපියල් 5000/= කින් වැටුප් වැඩිකිරීමක් සිදුකරන ලෙස වෘත්තිය සමිති විසින් දිගින් දිගටම ඉල්ලීම් ඉදිරිපත් කර තිබේ. එසේ වූ නමුත් පසුගිය මහින්ද රාජපක්ෂ ආණ්ඩුව හා හාම්පුතුන් එම ඉල්ලීම ගැන සලකා බැලීමක් නොකරන ලදි. එම පසු බිම තුළ පසුගිය ජනාධිපති වරණයේදී මෛත්‍රිපාල සිරිසේන මහතා පෞද්ගලික අංශයේ කම්කරුවන්ගේ වැටුප් වැඩි කරන බවට මැතිවරණ ප්‍රකාශණයෙන් පොරොන්දුවක් දුනි.**

එහෙත් මෛත්‍රිපාල මහතාගේ එම පොරොන්දුව අර්ථ ශූන්‍ය එකක් බවට මේ වන විට පත්ව තිබේ. නව රජයේ අතුරු අයවැය ලේඛණයෙන් රු 2500/= වැඩි කරන ලෙස ප්‍රකාශයට පත් කළද කොම්පැණි අයිතිකරුවන් එය තුට්ටුවකටවත් ගනන් ගත්තේ නැත. එබැවින් එම පොරොන්දුව ඉටු කිරීම සඳහා අයවැය සහන දීමනා පණතක් ලෙස පාර්ලිමේන්තුවේ සම්මත කර එය නීතියක් බවට පරිවර්තනය කරන ලෙස වෘත්තිය සමිති විසින් ඉල්ලා සිටින ලදි. මෛත්‍රි - රනිල් ආණ්ඩුව කම්කරුවන්ගේ මෙම ඉල්ලීම ගැන අවධානයක් යොමු නොකරන තත්වය අභියස පුද්ගලික පනත් යෝජනාවක් ලෙස නිදහස් වෙළඳ කළාප පොදු සේවා සංගමයේ ඉල්ලීම මත පාර්ලිමේන්තුවට පනතක් ඉදිරිපත් කිරීමට අජිත් කුමාර මන්ත්‍රිවරයා විසින් කටයුතු කරන ලදි.

කරුණු එසේ වුවද වැඩ කරන ජනතාවගේ බහුතරයක් වන පෞද්ගලික අංශයේ කම්කරුවන්ට ඔවුන් ඉල්ලා සිටින රු 5000/= දීම කෙසේ වෙතත් රු 2500/= වත් ලබා දීම යහපාලන ආණ්ඩුවේ වගකීමක් වනු ඇත. ඒ අතර ආණ්ඩුව නොබෝ දිනකින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම ගැන තොරතුරු වාර්තාවේ.

ආණ්ඩුවේ නායකයින් පසු පස වැඳ වැටීම වෙනුවට ආණ්ඩුවේ හොර නින්ද බිඳීම සඳහා වහාම සංඝෙටිත වැඩ වර්ජනයක් කැඳවීම සඳහා කටයුතු කිරීමට සමිති නායකයින්ට සාමාජිකයින්ගෙන් බලපෑම් එල්ල වීමට පටන්ගෙන ඇත. ආණ්ඩුව විසුරුවා හැරීමට පෙර වැටුප් ඉල්ලීම ජයග්‍රහණය කිරීම සඳහා පෞද්ගලික අංශයේ සියලු වෘත්තිය සමිති නායකයින් එක්ව සංඝෙටිත වැඩ වර්ජනයක් සඳහා තීරණ කළ යුතු බව රතු තරුව අවධාරනය කර සිටී.

# වැලිකඩ සිරකරුවන් ඝාතනය කළේ කව්ද ?











**සැලසුම් සහගතව ඇති කරලා යුද්දේ**
**අලුගෝසුවන් පසුවෙති නොකරම සද්දේ**
**අලුයම් රැයේ බැහැලයි දැම්මේ සුද්දේ**
**ගෙන ගොස් වැලිකඩට හාවට ඇයි විද්දේ**

(ඝාතනයට ලක්වූ නිර්මල අතපත්තුගේ පියා වන සිරිපාල අතපත්තුගේ කවියකි.)

2012 නොවැම්බර් 09 වෙනි දින වැලිකඩ බන්ධනාගාරයේ දී සිරකරුවන් ඝාතනයට ලක් කළ වුදිතයින්ට එරෙහිව නඩු පවරණ ලෙසත් එලෙස මියගිය සිරකරුවන්ගේ යැපෙන්නන් හට සාධාරණ වන්දි මුදලක් ලබා දෙන ලෙස ඉල්ලන උද්ඝෝෂණයක් ජුනි මස 16 වෙනි දින වැලිකඩ බණ්ධනාගාරය ඉදිරිපිටදී පැවැත්වින

එම උද්ඝෝෂණය වැලිකඩ බන්ධනාගාර රැඳවියන් ඝාතනයට එරෙහි ජනතා එකතුව සංවිධානය විසින් සංවිධානය කරන ලදි එක්සත් සමාජවාදි පක්ෂය ඇතුලු සංවිධාන කීපයක් මෙම උද්ඝෝෂණයට සහභාගි විය.

# චුන්නාකම් ජල ප්‍රශ්නය විසඳනු

යාපනය චුන්නාකම් ප්‍රදේශයේ පිහිටුවා තිබෙන උතුරු ජනනි විදුලි බල ව්‍යාපාරයට අදාලව සිදු කෙරෙමින් පවතින කම්හල් ආශ්‍රිතව ප්‍රදේශයේ පරිසරයට විශාල වශයෙන් බලපෑම් සිදුව තිබේ. එම ව්‍යාපෘති හරහා දැවිතෙල් විශාල වශයෙන් භූගත ජලයට කාන්දු වී ඇති හෙයින් එම ප්‍රදේශයේ ජනතාව ප්‍රයෝජනයට ගන්නා ලිංවල ජලය අප විත්‍ර වී ඇත. එම නිසා එම ලිං වල ජලය පානය කිරීමට කිසිසේත් නුසුදුසු අතර ජනතාව විවිධාකාර ලෙඩ රෝග වලට භාජනය වී ඇතැයිද වාර්තාවේ. එසේම මෙම තත්වය සමස්ථ යාපනය දිස්ත්‍රික්කයටම ක්‍රමයෙන් කාන්දු විය හැකි බව පරිසරවේදිහු පවසති. මේ වන විටත් වලිකාමම් ප්‍රදේශයේද ලිං ද විනාශ වී ඇති බව වැර්තා වේ.

මේ අතර ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ වාර්තාවකට අනුව එම ප්‍රදේශයේ ජලයට දැවිතෙල් හා ඊයම් ඇතුලු ජනතාවට අහිත කර ද්‍රව්‍ය කාන්දු වී ඇති බව අනාවරණය වී ඇත. චුන්නාකම් ප්‍රදේශයේ සිදුව තිබෙන මෙම විනාශය ගැන ජනතාව බලධාරින් වෙත පැමිණිලි කර ඇතත් මේ ගැන නිශ්චිත පියවරක් ගැනීමට ඔවුන් අපොහොසත්ව ඇත.

ජල ප්‍රශ්නයට විසඳුම් සොයා ගත නොහැකිව චුන්නාකම් ප්‍රදේශය හා අවට ප්‍රදේශ වල ජනතාව ගැටලු රාශියකට මුහුණ දී සිටී. මේ අතර චුන්නාකම් ප්‍රදේශයේ භූගත ජල දූෂණ ප්‍රශ්නය සම්බන්දව පරීක්ෂා කර අධිකරණයට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ශ්‍රේෂඨාධිකරණය පසු ගිය උතුරු පළාත් මහ ඇමති හා මධ්‍යම පරිසර අධිකාරියට නියෝග කර ඇත. පරිසර හා සොබාදහම් අධ්‍යාපන මධ්‍යස්ථානය විසින් ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගය හේතුකොට ගෙන අධිකරණය මෙම නියෝගය දී ඇතත් වගකිව යුත්තන් අවධි කිරීමට හෝ පරිසරයට හානිකර ව්‍යාපෘති නවතා දැමීමට කටයුතු කිරීමට ආණ්ඩුව පියවර ගන්නා බව

## The Committee for a Workers International

The Committee for a Workers' International (CWI) is the socialist international organization to which the United Socialist Party is affiliated.
The CWI is organized in 45 countries and Works to unite the Working class and oppressed peoples against global capitalism and to fight for a Socialist world.
For more details including CWI publications
Write to : CWI,PO.Box 3688,London E 111YE,
email:cwi@worldsoc.co.uk

# මහින්දගේ හොර මස්සිනා ඉරානයේ

මිනී මැරුම් චෝදනාවක් ඇතුලුව බරපතල දූෂණ හා වංචා ගනු දෙනු පිළිබඳ චෝදනා ලැබ සිටින හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ මස්සිනා වන උදයංග වීරතුංග ඉරානයේ සැඟවී සිටින බව හෙළිදරව් වී ඇත. යුක්‍රේනයේ කැරැලිකරුවන්ට නීති විරෝධීව ගිනි අවි අලෙවි කිරීම ඇතුලුව තානාපති සේවයේ යෙදී සිටියදී ඔහු යටතේ සේවය කළ අයගේ මරණය සම්බන්දව හා නිසි ටෙන්ඩර් පටිපාටියකින් තොරව මිග් යානා මිලදී ගැනීම යන කරුණු සම්බන්දව උදයන්ග වීරතුංග චෝදනා ලැබ සිටියි.

පසු ගිය දිනක ඔහු ඉරානයේ ටෙහෙරාන් නුවර පිහිටි ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලයට පැමිණ තමන්ට අයත් භාන්ඩ සහිත කන්ටේනරයක් ශ්‍රී ලංකාවට එවීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට ඉල්ලා තිබේ. තොරතුරු වාර්තාවන අන්දමට ලංකාවේ තානාපති කාර්යාලය ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. මහින්දගේ මස්සිනාගේ එනම් උදයංග වීරතුංගගේ විදෙස් ගමන් බලපත්‍රය අවලංගු කර ඇති බවත් ඔහුට එරෙහිව බරපතළ චෝදනා ඇති බවටත් ලංකා ආණ්ඩුව සියලු රට වලට දන්වා ඇති බව විදේශ කටයුතු අමාත්‍යංශය වාර්තා කර ඇත.

කරුනු එසේ තිබියදී උදයංග වීරතුංග ඉරානයේ ලංකා තානාපති කාර්යාලයට පැමිණ තම අවශ්‍යතා ඉටු කර ගැනීමට කටයුතු කිරීමට එහි පැමිනි අවස්ථාවේ මෙරට අධිකරණයට අවශ්‍ය මෙම පුද්ගලයා ගැන නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ඇයිද යන්න තවත් බරපතල ප්‍රශ්නයකි.




ඔබත් කූපනය පුරවා එවන්න

එක්සත් සමාජවාදී පක්ෂය
ஐக்கிய சோசலிச கட்சி
UNITED SOCIALIST PARTY

නම ..............................

ලිපිනය ..............................

රැකියාව ..............................

දුරකථනය ..............................

එක්සත් සමාජවාදී පක්ෂය
53/6 ඊ.ඩී.දාබරේ මාවත, නාරාහේන්පිට, කොළඹ 05. Tel: 011 4510289 Email: usp@sltnet.lk

එම් කේ පියරත්න වන මා විසින් 53/6 ඊ ඩී දාබරේ මාවත නාරාහේන්පිට පිහිටි සමාජ පොත් පියස මුද්‍රණාලයෙහිදී මුද්‍රණය කරන ලදී